

වාර්ෂික වාර්තාව

2014

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය



ලිපිනය

විද්‍යා මාවත,

කොළඹ 07

වෙබ් අඩවිය

www.dmc.gov.lk

විද්‍යුත් තැපෑල

info@dmc.gov.lk

හදිසි ඇමතුම්

0112136222 / 2670002 / 117

පටුන

1		හැඳින්වීම	**1**
	1.1	ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව	**1**
	1.2	ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා	**2**
2		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්	**3**
	2.1	දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ	**3**
	2.2	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්	**3**
	2.3	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය	**4**
	2.4	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව සහ කාර්යය මණ්ඩලය බඳවා ගැනීම්	**5**
	2.4.1	කාර්යය මණ්ඩලය බඳවා ගැනීම්	**5**
	2.4.2	දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක	**6**
	2.5	අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අදහස්	**7**
	2.5.1	ආපදාවල බලපෑම් සම්බන්ධ විශ්ලේෂණය - **2014**	**7**
	2.5.2	අභියෝග	**9**
	2.5.3	**2014** සඳහා නිර්දේශ	**11**
3		ජාතික මට්ටමේ සිදුකරන ප්‍රධාන කටයුතු	**11**
	3.1	ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම	**11**
	3.2	ශ්‍රී ලංකා ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය	**11**
	3.3	ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම	**12**
	3.4	ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම	**12**
	3.5	ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම	**12**
	3.6	සංයුක්ත සැලැස්ම	**12**
	3.7	අන්තර්කාලීන කළමනාකරණ කමිටුව	**12**
	3.8	විගණන සහ කළමනාකරණ කමිටුව	**12**
	3.9	දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය - **2014**	**13**
	3.10	ජාතික සුරක්ෂිත දිනය - **2014**	**13**
	3.11	ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය	**14**
	3.12	හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව	**14**
	3.13	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය (www.dmc.gov.lk)	**15**
	3.14	ඩෙස්ඉන්වෙන්ටර් දත්ත පදනම (www.desinventar.lk)	**16**
4		ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය	**15**
	4.1	පසුබිම	**15**
	4.2	දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවම කිරීම	**16**
	4.3	දිස්ත්‍රික් පදනම මත ආපදා අවම කිරීම සඳහා **2014** වර්ෂයට ප්‍රතිපාදන වෙන් කිරීම	**17**

4.4		ගංවතුර පාලනය	20
	4.4.1	පානදුර ගංවතුර පාලනය	20
	4.4.2	දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීම	21
	4.4.3	යාපනය ගංවතුර ආපදා අවම කිරීම	22
4.5		ආපදා අවදානම අවම කිරීම, සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන ධාරාව තුළට ඒකාබද්ධ කිරීම	23
4.6		ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගිත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්	24
5		දැනුවත් කිරීමේ අංශය	25
5.1		හැඳින්වීම	25
5.2		2014 වර්ෂය සඳහා අරමුදල් වෙන් කිරීම	25
5.3		ජාතික මට්ටමේ වැඩසටහන්	27
	5.3.1	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා ජාතික මට්ටමේ ධාරිතා වර්ධන වැඩසටහන්	27
	5.3.2	පාර්ශවකරුවන්ගේ ධාරිතා වර්ධනය	28
5.4		පළාත් මට්ටමේ වැඩසටහන්	28
	5.4.1	පළාත් මට්ටම තුළ පාර්ශ්වකරුවන්ගේ ධාරිතා වර්ධනය	28
	5.4.2	පළාත් පාලන ආයතනයන්ගේ ධාරිතා වර්ධනය	29
	5.4.3	සිද්ධි විධාන පද්ධතිය **(Incident Command System – ICS)**	29
	5.4.4	ආගමික ප්‍රජාවගේ ධාරිතා වර්ධනය	30
	5.4.5	බරපතල ආපදා අවදානමක් පවතින ප්‍රදේශයන්හි කාන්තාවන්ගේ ධාරිතා වර්ධනය	30
5.5		පාසල් ගුරුවරුන් හා පාසල් සිසුන් සඳහා පුහුණු වැඩසටහන්	30
5.6		ආපදා කළමනාකරණ ග්‍රාමීය කමිටුවල ධාරිතා වර්ධනය	31
5.7		ස්වේච්ඡා කණ්ඩායම් ස්ථාපිත කිරීම	31
5.8		දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටු සාමාජිකයන්ගේ ධාරිතා වර්ධනය	32
5.9		ජාතික සහ ප්‍රාදේශීය ප්‍රදර්ශණ තුළින් මහජනතාව දැනුවත් කිරීම	32
5.10		ජංගම රථ යොදා ගනිමින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	32
5.11		දැනුවත් කිරීම සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය මුද්‍රණය කිරීම	33
5.12		විදේශීය පුහුණු සහ වැඩමුළු	33
6		පෙර සූදානම් හා සැලසුම් අංශය	33
6.1		හැඳින්වීම	33
6.2		ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පවත්වන පෙරහුරු අභ්‍යාස	35
6.3		විශාල ජලාශ වේලි ආශ්‍රිත ආපදා සම්බන්ධයෙන් පෙර සූදානම් කටයුතු	37
6.4		දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලසුම් වැඩිදියුණු කිරීම	38
6.5		ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලසුම්	38
6.6		ග්‍රාමීය ආපදා කළමනාකරණ සැලැසුම් සකස් කිරීම	40

6.7		ප්‍රත්‍යාස්ථ නගර වැඩසටහන	41
6.8		රට තුළ දියේ ගිලීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම	41
6.9		පෙර සූදානම් සැලසුම් අංශය විසින් සිදුකරනු ලබන විශේෂ ව්‍යාපෘති	42
7		හදිසි මෙහෙයුම් අංශය	42
7.1		හැඳින්වීම	42
7.2		ප්‍රධාන ආපදාවල දී හදිසි ප්‍රතිචාර දැක්වීම	43
	7.2.1	නියඟයෙන් බලපෑමට පත් ජනතාව	43
	7.2.2	ගංවතුර හේතුවෙන් බලපෑමට පත් ජනතාව	43
	7.2.3	නායයෑම් සහ බෑවුම් කඩා වැටීම	43
	7.2.4	දැඩි සුළං ආපදා	44
	7.2.5	ගංවතුර සහ අනෙකුත් ආපදා පිළිබඳව වන හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා අවශ්‍ය වන හදිසි අවස්ථා උපකරණ මිලට ගැනීම	44
	7.2.6	ලැව්ගිනි / ගිනි උවදුරු ආපදාවලදී හදිසි ප්‍රතිචාර	44
	7.2.7	අකුණු සැර වැදීම	45
7.3		2014 වසර තුළ සිදුවූ ආපදා සිදුවීම් හා අලාභ හානි	45
7.4		හදිසි මෙහෙයුම් අංශය මඟින් සිදුකරන වෙනත් හදිසි පෙර සූදානම් කටයුතු	46
	7.4.1	පූර්ව දැනුම් දීම් විසුරුවා හැරීම	46
	7.4.2	අන්තර් රාජ්‍ය ජාලය **(Intra Government Network)**	46
	7.4.3	ශ්‍රී ලංකා ආපදා සම්පත් ජාලය **(SLDRN)**	46
	7.4.4	සුනාමි අවස්ථාවලදී ජනතාව ආරක්ෂිත ස්ථාන කරා ඉවත් කිරීම පිළිබඳ පෙරහුරු වැඩසටහන්	46
	7.4.5	ඇමතුම් මධ්‍යස්ථානය	47
	7.4.6	**VHF** සංඛ්‍යාතයන් ඔස්සේ සියළුම පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු සඳහා හඬ පණිවිඩ ලබාදීමේ පහසුව ස්ථාපිත කිරීම	48
	7.4.7	කෙටි පණිවිඩ ව්‍යාප්ත කිරීමේ යාන්ත්‍රණය **(SMS)**	48
	7.4.8	හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව	48
	7.4.9	ඩෙංගු මර්දන වැඩසටහන්	48
	7.4.10	ජාතික හදිසි මෙහෙයුම් සැලස්ම **(NEOP)**	49
	7.4.11	ආපදා කළමනාකරණය සඳහා වන සිද්ධි විධාන පද්ධතිය **(ICS)** පිළිබඳ අන්තර් - මධ්‍ය පුහුණු පාඨමාලාව	49
	7.4.12	ශ්‍රී ලාංකීය නගර සඳහා ආපදා ප්‍රත්‍යාස්ථ නගර සංවර්ධනය කිරීම හා උපාය මාර්ග	50
	7.4.13	2015 වර්ෂයේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම (රු. මි. 11.4) විදෙස් අරමුදල්	50
	7.4.14	ශ්‍රී ලංකාවේ වෙරළ තීරය ආශ්‍රිත උවදුරු සඳහා සියළුම ස්ථරයන් ආවරණය වන බහුවිධ උවදුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිවල ධාරිතාවය ඉහළ නැංවීම	50
	7.4.15	වෙරළබඩ උවදුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් සහ ප්‍රතිචාර : මෙවලම් සහ ජාත්‍යන්තර වශයෙන් සවිමත් කිරීම (2012 – 2014) **(RIMES)**	52

7.5		**2014** වර්ෂය තුළදී හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය **(EOC)** මඟින් සිදුකරන ලද වෙනත් ක්‍රියාකාරකම්	**52**
	7.5.1	**EOC** වාරිකා සහ පුහුණු	**52**
8		**2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය	**53**
9		**2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව	**94**
10		**2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව පිළිබඳ අදහස්	**105**

වාර්ෂික වාර්තාව - 2014

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වන ප්‍රධානතම ආයතනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වේ. අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව ආපදා අවම කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම ආයතනය වෙතය.

ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව යටතේ ක්‍රියාත්මක ආයතනය ලෙස 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතෙහි 13 වන වගන්තිය ප්‍රකාරව මෙම ආයතනය පිහිටුවන ලදි. ජාතික ප්‍රතිපත්ති සැලසුමේ සහ ක්‍රමෝපායික මහපෙන්වීම ලබාදීම පිළිබඳ කාර්යය ජාතික සභාව වෙත පැවරී ඇති අතර, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඒ සඳහා මහපෙන්වීම ලබා දීම සිදු කරනු ලැබේ. ප්‍රතිචාර මත පදනම් යාන්ත්‍රණයෙන් බැහැරව ප්‍රගාමී ප්‍රවේශයක් ලබාගැනීම උදෙසා ප්‍රතිපත්තිමය විතැන්වීමක් සඳහා යොමු වෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සම්පූර්ණයෙන් ම ආවරණය කරන ව්‍යසන අවදානම් අඩු කිරීමේ වැඩසටහන් සඳහා වන කාර්ය රාමුවක් බවට 2005 අංක 13 දරන මෙම පනත පත් විය.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වනුයේ ආපදා අවම කිරීම, පෙර සූදානම් සැලසුම් සැකසීම, මහජන දැනුවත් කිරීම්, අවදානමට ලක්ව ඇති ජනතාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ අනෙකුත් ප්‍රධාන ආයතන හා එක්ව සහන සහ පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යසන අවදානම් තත්ත්ව අඩු කිරීමේ කටයුතු සියලුම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඇත.

1.1 ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාව

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතින් පවරා ඇති පරිදි ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව 2005 වසරේදී පිහිටුවන ලදි. මෙය ආපදා කළමනාකරණයේ ප්‍රධාන ස්ථානය වන අතර එය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ උප සභාපතිත්වයෙන් යුතු ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ නියෝජනයක් සහිත ආයතනයකි. ආපදා කළමනාකරණ ජාතික සභාවේ අනෙකුත් සාමාජිකයන් වන්නේ පනතේ විශේෂයෙන් සඳහන් කර ඇති තෝරා ගත් විෂයයන් භාරව සිටින අමාත්‍යවරුන් පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන් (ප්‍රධාන අමාත්‍යවරයාට සහභාගිවීමට නොහැකි විට එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා) සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් පස් දෙනෙකුගෙන් යුතු කණ්ඩායමකි. (සටහන 1.1)

අතිගරු ජනාධිපතිතුමා විසින් මූලාසනය දරන ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව 2012 මැයි 11 දින රැස්වී ආපදා අවදානම් ක්‍රියාකාරකම්වලට අදාළ කාරණා විශේෂයෙන්ම රට තුළ සිදුවන සංවර්ධන සැලසුම්, නායයෑම් සහ ගංවතුර ආදිය සම්බන්ධ ගැටලු සාකච්ඡා කරන ලදී. එම රැස්වීමේ දී වැදගත් ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් ගනු ලැබීය.

<u>ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ සංයුතිය</u>



සටහන 1.1: ජාතික සභාවේ සංයුතිය

1.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන උවදුරු

2005 අංක 13 දරන පනත අනුව ආපදා කළමනාකරණය යටතට ගැනෙන උවදුරු වන්නේ,

- නායයාම්
- සුළි සුළං
- ගං වතුර
- නියහය
- කාර්මික ආපදා
- සුනාමි
- භූමි කම්පා
- වසංගත තත්වයන්
- පිපිරීම්
- ගුවන් ප්‍රහාර
- සිවිල් හෝ අභ්‍යන්තර අරගල
- රසායනික අනතුරු
- විකිරණ සම්බන්ධ හදිසි අවස්ථා
- අභ්‍යන්තර සහ මුහුදු කාන්දුවීම් ඇතුළත් තෙල් කාන්දු වීම්

- ගුවන් උවදුරු
- මුහුදු උවදුරු
- ගිනි
- න්‍යෂ්ටික ආපදා
- නාගරික සහ වනාන්තර ගිනි ගැනීම්
- වෙරළ බාදනය
- ටොනාඩෝ, අකුණු ගැසීම් සහ දැඩි ගිගුරුම් සහිත කුණාටු

2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්

අධ්‍යක්ෂ ජනරාල්වරයෙක්ගේ ප්‍රධානත්වයෙන් සහ අධ්‍යක්ෂවරුන්ගේ නායකත්වය සහිත අංශ හයක් සහිතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. එම අංශ හය වන්නේ, අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය, පෙර සූදානම් හා සැලසුම් අංශය, පුහුණු හා දැනුවත් කිරීමේ අංශය, හදිසි මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීමේ අංශය, මානව සම්පත් අංශය හා මූල්‍ය අංශය වේ. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකාරක කමිටු දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇත. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහායකවරුගේ සහාය සහිතව සහකාර අධ්‍යක්ෂවරු දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකාරක කමිටු භාරව කටයුතු කරති.

2.1 දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ

<u>දැක්ම</u>

ශ්‍රී ලංකාවේ සුරක්ෂිත ප්‍රජාවක් ස්ථාපිත කිරීම තුළින් තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීම.

<u>මෙහෙවර</u>

ස්වාභාවික, තාක්ෂණික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ආපදා ක්‍රමානුකූලව කළමනාකරණය තුළින් ප්‍රජාව තුළත් පොදුවේ පවුල් ඒකක තුළත් සුරක්ෂිත වූ සංස්කෘතියක් ගොඩනැඟීම.

<u>අභිමතාර්ථ</u>

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, පලාත් සභා, පලාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරි පරිපාලනයෙන් සමන්විත වන දීපව්‍යාප්ත පරිපාලන ව්‍යුහය හරහා රටෙහි පවතින සියලුම ආපදා අවදානම් කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති කාර්යයන් වන්නේ,

- ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මක් සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් නිර්මාණය කිරීම.
- උවදුරු සිතියම්ගත කිරීම සහ අවදානම් තත්ත්ව තක්සේරු කිරීම.
- පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම.

- පෙර සූදානම් සැලසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහායවීම ඇතුළුව ව්‍යසන සඳහා ප්‍රතිචාර දැක්වීමට පෙර සූදානම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- පූර්ව අනතුරු ඇඟවීම් සිදුකිරීම සහ ඒවා ප්‍රචාරය කිරීම.
- හදිසි අවස්ථා මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ සෝදිසි සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.
- සහනාධාර බෙදාදීම ඇතුළු පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආපදා අවම කිරීම.
- පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- ආපදා අවදානම් අඩු කිරීම සඳහා සංවර්ධන ක්‍රියාවලියට අන්තර්ගත කිරීම.
- දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය වීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- නිසි කලට තම වගකීම් ඉටු කරන බවට වගබලා ගැනීම සඳහා ව්‍යසන අවදානම් අඩුකිරීමේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, පුද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන දේශීය සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අදාළ ආයතන සමග සම්බන්ධ වී කටයුතු කිරීම.
- ආපදා අවම කිරීම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ව්‍යසනවලින් පසු යථා තත්ත්වයට පත්වීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම, ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

2.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය.

සටහන **2.1**හි දක්වා ඇති පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විවිධ වැඩසටහන් සැලකිල්ලට ගනිමින් මෙම ආයතනික ව්‍යුහය සකස් කර ඇත.



සටහන 2.1: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සංවිධාන ව්‍යුහය

2.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව සහ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්

2.4.1 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සම්මත කරන ලද නව බඳවා ගැනීම් පටිපාටිය අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කර ඇති අතර වසර අවසාන වන විට ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික්ක මට්ටමේ තිබූ පුරප්පාඩුවලින් 75%ක් පමණ පුරවා ඇත. පහත 2.1 වගුවෙන් 2014 වසරේ පුරවන ලද පුරප්පාඩු සංඛ්‍යාවත් පහත 2.2 වගුවෙන් අනුමත කරන ලද සම්පූර්ණ සේවක සංඛ්‍යාවත්, පුරවන ලද පුරප්පාඩු සංඛ්‍යාවත් 2014-12-31 වන විට තිබූ පුරප්පාඩු සංඛ්‍යාවත් දක්වා ඇත.

තනතුර	පුරවන ලද පුරප්පාඩු
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	1
අධ්‍යක්ෂ (අවම කිරීම්, පර්යේෂණ සහ සංවර්ධන)	1
රියදුරු	2
කාර්යාල කාර්යය සහයක	1
එකතුව	**5**

වගුව 2.1: 2014 වර්ෂයේ දී පුරවන ලද පුරප්පාඩු

තනතුර	තනතුරු සංඛ්‍යාව		
	අනුමත සේවක සංඛ්‍යාව	පුරවන ලද සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අධ්‍යක්ෂ	5	3	2
අභ්‍යන්තර විගණක	1	1	0
නියෝජ්‍ය අධ්‍යක්ෂ	7	0	7
සහකාර අධ්‍යක්ෂ	15	14	1
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	25	19	6
මූල්‍ය නිලධාරි	1	1	0
පරිපාලන නිලධාරි	1	0	1
පුස්තකාලයාධිපති	1	0	1
සංවර්ධන සහකාර	1	1	0
භාෂා පරිවර්තක	2	0	2

තොරතුරු තාක්ෂණ සහකාර	2	0	2
පුද්ගලික සහකාර	1	0	1
වංචල සහ නිශ්චල ශිල්පි	1	0	1
සන්නිවේදන කාර්මික ශිල්පි	3	0	3
ගුවන් විදුලි ක්‍රියාකරු	1	0	1
කළමනාකරණ සහකාර	46	46	0
ආපදා කළමනාකරණ සහකාර	100	97	3
රියදුරු	35	34	1
කාර්යාල කාර්ය සහායක	7	6	1
එකතුව	**256**	**224**	**32**

වගුව 2.2: **2014.12.31 වන විට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව**

2.4.2 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දිස්ත්‍රික්ක විසි පහ පුරා ම පිහිටුවා ඇත. සෑම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයක්ම සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරයෙක්ගෙන් සමන්විත වේ. යම්කිසි දිස්ත්‍රික්කයක් ආපදාවට ලක්වීමට ඇති හැකියාවේ අඩු වැඩිකම මත දිස්ත්‍රික් ආපදා කළමනාකාරවරු සංඛ්‍යාව දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වේ. අනුමත කර ඇති සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) 25 දෙනාගෙන් 19ක් බඳවාගෙන තිබෙන්නේ සිවිල් පුද්ගලයන්ගෙන් වන අතර අනෙක් 06 දෙනා සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි තාවකාලිකව වැඩ බැලීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් සහ යුධ හමුදාවෙන් බඳවා ගෙන තිබේ. මීට අමතරව සියලුම ආපදා කළමනාකරණ සහකාරවරු සහ රියදුරන් විසි පස්දෙනා දිස්ත්‍රික්ක 25 හි සේවයේ නියුතු වී සිටිති.

අධිකාරි බලයලත් නිලධාරීන් 06 දෙනෙකු ඇතුළුව යුධ හමුදාවේ සහ ගුවන් හමුදාවේ 152ක් කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ පුත්තලම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ පාලන ඒකකවලට අනුයුක්ත කර තිබේ. කළුතර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල හැර අනෙකුත් සියලුම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා තිබෙන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ වේ. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය පහත 2.2 රූප සටහනෙහි දක්වා ඇත.



සටහන 2.2: දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය

2.5 අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අදහස්

2.5.1 ආපදාවල බලපෑම සම්බන්ධ විශ්ලේෂණය - 2014

<u>සමස්ත බලපෑම - 2014</u>

2012 සහ 2013 සමඟ සැසඳීමේදී විශාල ව්‍යසන සිදුවීමේ ප්‍රමාණය 2014 වසරේ දී වැඩිවී ඇති බව නිරීක්ෂණය විය. ගංවතුර සහ නායයෑම් කිහිපයක් ම නිරිත දිග සහ ඊසාන දිග මෝසම් සුළං නිසා ඇතිවිය.

ගංවතුර/ නායයෑම් - ජුනි සහ ජූලි නිරිත දිග හා ඊසාන දිග මෝසම්

නායයාම් - මීරියබැද්ද - ඔක්තෝබර් - අන්තර් මෝසම්

ගං වතුර/ නායයාම් - ඊසාන දිග මෝසම් - දෙසැම්බර්

ගංවතුර, නායයෑම්, දැඩි සුළං, නියඟය, දියේ ගිලීම්, වෙරළ ඛාදනය, ගිනි, රසායනික සහ සත්ත්ව ප්‍රහාර 2013 වර්ෂයේ බහුල වශයෙන් ඇති වූ ආපදා ලෙස වර්ග කර ඇත.

ආපදා නිසා 2014 වසරේ පීඩාවට පත්වූ සමස්ත ජනගහනය මිලියන 2.7ක් පමණ වන අතර ඉන් මිලියන 1.5ක් නියඟය නිසා ද මිලියන 1.0ක් ගංවතුර නිසා ද, පීඩාවට පත්වී තිබේ. එය 2013 සමඟ සැසඳීමේදී තුන් ගුණයක පමණ වර්ධනයකි. මුළු මරණ සංඛ්‍යාව (මෙහෙයුම් ද ඇතුළුව) සහ වාර්තා වූ

තුවාලකරුවන් පිළිවෙලින් 154ක් සහ 80ක් වේ. 2013 සමඟ සන්සන්දනය කිරීමේ දී හානියට පත් වූ නිවාස සංඛ්‍යාව සැලකිය යුතු සංඛ්‍යාවකින් ඉහළ ගොස් තිබේ. ගංවතුර සහ දැඩි සුළං නිසා නිවාස 80%ක් පමණ විනාශ වී තිබේ.

බලපෑම	2013	2014	වෙනස (%)
මරණ / අතුරුදහන් වීම්	140	154	10.0
තුවාල ලැබුවන්	225	80	-64.4
පීඩාවට පත් ජන සංඛ්‍යාව	574130	2702545	370.0
විනාශ වූ නිවාස	741	5312	616.1
හානියට පත් නිවාස	10048	19495	94.0

වගුව 2.3: සමස්ත බලපෑම

ii. එක් එක් ආපදා බලපෑමෙන් විනාශ වූ / හානියට පත් වූ නිවාස- 2014

නිරිත දිග මෝසම් සුළං සහ ඊසාන දිග මෝසම් සුළංවල බලපෑම සැලකිය යුතු මරණ, තුවාල වීම් සහ නිවාසවලට සිදු වූ හානිවලට හේතු විය. නිරිත දිග මෝසම් සුළං සහ ඊසානදිග මෝසම් සුළං නිසා හානි වූ නිවාස සංඛ්‍යාව පිළිවෙලින් 4,689ක් සහ 17,957ක් විය. මරණ සහ තුවාල වීම් උග්‍ර වූ අවස්ථා තුනක් නිරිත දිග මෝසම් සුළං කාලය එනම් (ජූනි/ ජූලි) තුළ දක්නට ලැබුණ අතර ඊසාන දිග මෝසම් සුළං කාලය (දෙසැම්බර්) මීරියබැද්ද නායයාම (ඔක්තෝබර්) දක්නට ලැබුණි.

පීඩාවට පත් වූ වැඩිම ජනසංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන 1.5ක් උතුරු, නැගෙනහිර පළාත්වල හම්බන්තොට සහ කුරුණෑගල දිස්ත්‍රික්ක ද ඇතුළත්ව අගෝස්තු මාසයේ දී වාර්තා විය.



සටහන 2.3: නිරිත දිග සහ ඊසාන දිග මෝසම් හේතුවෙන් සිදු වූ මරණ/අතුරුදහන් සහ තුවාල



සටහන 2.4: නිරිත දිග සහ ඊසාන දිග මෝසම් හේතුවෙන් විනාශ වූ / හානියට පත් වූ නිවාස



සටහන 2.5: හානි වූ / විනාශ වූ නිවාස බෙදා දීම

iii. ආපදා තත්වයන්හි බලපෑම දිස්ත්‍රික්ක අනුව - 2014



සටහන 2.6: පීඩාවට පත් වූ ජනතාවගේ ව්‍යාප්තිය



සටහන 2.7: හානියට පත්/ විනාශ වූ නිවාසවල ව්‍යාප්තිය

2014 වසරේ පීඩාවට පත් වූ ජනතාව වැඩිම වශයෙන් සිටින දිස්ත්‍රික්ක වශයෙන් ත්‍රිකුණාමලය, මඩකලපුව, පොළොන්නරුව, මොනරාගල සහ හම්බන්තොට දැක්විය හැකිය. කළුතර, පුත්තලම, කුරුණෑගල සහ යාපනය දිස්ත්‍රික්කවල ද සැලකිය යුතු සංඛ්‍යාවක් පීඩාවට පත් වී තිබේ.

නිවාස හානි වූ දිස්ත්‍රික්ක අතර ඉහළින්ම ඇති දිස්ත්‍රික්ක වන්නේ කිලිනොච්චි, මුලතිව්, පොළොන්නරුව, මඩකලපුව හා බදුල්ල යන දිස්ත්‍රික්ක වේ.

සමස්තයක් වශයෙන් කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, නුවරඑළිය, මඩකලපුව, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක 2013 වසරේ දී විවිධ ආපදාවලට නිරන්තරයෙන් බලපෑ දිස්ත්‍රික්ක ලෙස දැක්විය හැකිය.

2.5.2 අභියෝග

I. තොරතුරු තාක්ෂණ, තාක්ෂණික උපකරණ සහ පුහුණුව

හදිසි ආපදා අවස්ථාවක දී ආපදාවට ලක්විය හැකි පුද්ගලයන්ට තොරතුරු ලබා දීම සඳහා කාර්යක්ෂම සන්නිවේදන ජාලයක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව තිබිය යුතුය. කෙසේ වෙතත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව පවතින සන්නිවේදන සම්ප්‍රේෂණ ජාලය ආපදාවලට ලක්විය හැකි සමස්ත ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ.

II. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තුළ සැලසුම් අධීක්ෂණ සහ ඇගයුම් අංශයක් නොමැති වීම.

ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට මධ්‍යම රජයෙන් මෙන්ම ජාත්‍යන්තර සහ දේශීය රාජ්‍ය නොවන

සංවිධානවලින් ද ආධාර ලැබේ. එම අරමුදල් ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා සැලසුම් අධීක්ෂණ සහ ඇගයුම් අංශයක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තුළ ස්ථාපිත කළ යුතුය. අධීක්ෂණ සහ ඇගයුම් අංශයක් නොමැතිවීම ආයතනයේ කාර්ය සාධනය වෙත අහිතකර ලෙස බලපා තිබේ.

III. දත්ත හුවමාරු කර ගැනීමට අදාළ කරුණු

ගංවතුර, නායයාම් සහ නියඟය වැනි ආපදාවල බලපෑම අවම කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් දත්ත බෙදා ගැනීම සහ දත්ත හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන අතර සමහර රාජ්‍ය ආයතන දත්ත හුවමාරු කර ගැනීමට අකමැත්තක් දක්වයි.

IV. කාර්ය මණ්ඩල අවශ්‍යතා

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව එම ආයතනයේ තිබූ පුරප්පාඩුවලින් 75% ක් පුරවන ලදී. කෙසේ වෙතත් අධ්‍යක්ෂ (හදිසි මෙහෙයුම්), අධ්‍යක්ෂ (අවම කිරීම්, පර්යේෂණ සහ සංවර්ධන) , අධ්‍යක්ෂ (මානව සම්පත් සහ මූල්‍ය), ගුවන් විදුලි ක්‍රියාකරු, තොරතුරු තාක්ෂණ සහකාර සහ කැමරා ශිල්පි යන තනතුරු තවමත් පුරප්පාඩුව පවතියි. මෙම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම අඩු වැටුප් සහ වරප්‍රසාද අඩුකම නිසා අපහසු වී තිබේ. එසේම තාක්ෂණ නිලධාරීන් බඳවා ගැනීම අපහසු වී ඇත්තේ මූලික සුදුසුකම් ලෙස ඉල්ලා ඇති සුදුසුකම්වල දක්වා ඇති ප්‍රමිතියේ මට්ටම් නිසාය. එම නිසා මෙම තනතුරු සඳහා අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් ඉල්ලුම් කර ඇති අතර ඒ අතර සුදුසුකම් සහිත අපේක්ෂකයන් නොමැත.

V. දේශගුණික වෙනස්කම් සහ එහි අහිතකර ප්‍රතිඵල

දේශගුණික වෙනස්වීම් නිසා පසුගිය වසර කිහිපය තුළ අසාමාන්‍ය දේශගුණික තත්ත්වයන් අත් විඳීමට සිදුවිය. එසේම, ඉතාම කෙටි කාලයක් තුළ දැඩි වර්ෂාපතනයක් ලැබීම නිසා සමහර ආපදා ඇතිවිය. මෙවන් අවිනිශ්චිත කාලගුණික තත්වයන් තුළ නිවාස, යටිතල පහසුකම්, වගාවන් සහ පශු සම්පත් විනාශ වේ. එමනිසා ආපදා සඳහා සූදානම් වීම සහ දේශගුණික වෙනස්කම්වලට හුරුවීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය. දේශගුණික වෙනස්කම්වල අහිතකර ප්‍රතිඵල සම්බන්ධයෙන් ප්‍රජාවන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය. දේශගුණික වෙනස්කම් නිසා සිදුවන අභියෝගවලට මුහුණ දීම සඳහා හදිසි ප්‍රතිචාර යාන්ත්‍රණයන් බලාත්මක කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය.

2.5.3 2014 සඳහා නිර්දේශ

පවතින අරමුදල් සහ විවිධ ප්‍රදේශවලට ආපදාවලට ගොදුරු වීමේ හැකියාව පිළිබඳ සලකා බලා ප්‍රමුඛතා පදනම මත පහත සඳහන් ක්‍රියාකාරකම් 2014 වසර සඳහා ක්‍රියාත්මක කිරීම / අඛණ්ඩව පවත්වාගෙන යාම සිදු කළ යුතුය.

- ආපදා පෙර සූදානම් සහ හදිසි ප්‍රතිචාර සැලසුම් දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරි මට්ටමෙන් පවත්වාගෙන යාම.
- සුනාමි, ගංවතුර සහ නායයෑම්වලට ගොදුරු විය හැකි ප්‍රදේශවල ප්‍රජා මට්ටමේ දැනුවත් කිරීම්, සූදානම් වීම් සහ සිතියම් ගත කිරීමේ කටයුතු.
- ප්‍රත්‍යාස්ථ නගර වැඩසටහන සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ප්‍රධාන වේලිවල ගඟ පහළ ජීවත් වන ආපදාවන්ට ලක්විය හැකි ප්‍රාදේශීය ලේකම් සහ ග්‍රාම නිලධාරි කොට්ඨාස සඳහා සූදානම් වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ සැලසුම් සකස් කිරීම.
- පාසල් ආපදා ආරක්ෂණ සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා පාසල්වලට සහාය දීම.
- පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රියාවලියේ දැනට පවතින ධාරිතාව කෙටි පණිවිඩ සහ වී.එච්.එෆ් (VHF) ගුවන් විදුලි සන්නිවේදනයන් හරහා ජනතාවට ලබා දිය හැකි ආකාරයට පුළුල් කිරීම.
- හානියට පත්විය හැකි ජනතාවට ශ්‍රී ලංකා ටෙලිකොම් හි ස්ථාවර දුරකථන භාවිතකොට පූර්ව අනතුරු ඇඟවීම් සිදු කිරීම.
- හදිසි ප්‍රතිචාර උපකරණ මිලට ගැනීම සහ අදාළ ආයතනවලට බෙදා හැරීම.
- හානියට පත්විය හැකි ධීවර ප්‍රජාව දැනුවත් කිරීම සහ ධාරිතා වර්ධනය.
- සූදානම් වීමේ සැලසුම් සකස් කිරීම සඳහා රජයේ නියෝජිත ආයතනවලට සහාය දෙන අතරම ආපදාවලට මුහුණ දීම සඳහා සූදානම් වීම.
- ජාතික, දිස්ත්‍රික්ක මට්ටමේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය.

3. ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීමේ කාර්යය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අවසන් කර ඇති අතර එම සංශෝධිත පනත් කෙටුම්පත නීතිපති අනුමැතිය සඳහා යොමු කර ඇත.

3.2 ශ්‍රී ලංකා ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය

මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර එය දැන් අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ඇතුළත් කර තිබේ.

3.3 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම

ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ දල කෙටුම්පත 2009 දී සංශෝධනය කළ අතර අමාත්‍ය මණ්ඩලයේ සහ ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාවේ අනුමැතිය 2013 දී ලබා ගත් අතර 2014 දී මුද්‍රණය කරන ලදී.

3.4 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම

ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම කෙටුම්පත් කර ඇත.

3.5 ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය දල කෙටුම්පත සකස් කර ඇත.

3.6 සංයුක්ත සැලැස්ම

2010 සකස් කළ සංයුක්ත සැලැස්ම සංශෝධනය කර 2012 සම්පූර්ණ කර ඇත. 2013 -2017 වර්ෂය සඳහා සකස් කළ සංයුක්ත සැලැස්ම ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාව විසින් අනුමත කර තිබේ.

3.7 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් මූලිකත්වය දරන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකාරිත්වය සම්බන්ධයෙන් අදාළ තීරණ ගැනීම සඳහා 2014 වසර තුළ වාර 10ක් රැස්විය. අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

1) ලේකම් (ආපදා කළමනාකරණ අමාත්‍යාංශය) - සභාපති
2) නියෝජිත, මුදල් සහ ප්‍රතිපත්ති සැළසුම් අමාත්‍යාංශය - සාමාජික
3) නියෝජිත, ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය - සාමාජික
4) නියෝජිත, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය - සාමාජික
5) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - සාමාජික
6) ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සාමාජික
7) අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - ලේකම්

3.8 විගණන සහ කළමනාකරණ කමිටුව

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන සහ කළමනාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

1) අතිරේක ලේකම්, ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය - සාමාජික
2) අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - සාමාජික

3) ප්‍රධාන ගණකාධිකාරී, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සාමාජික
4) නියෝජිත, මහා භාණ්ඩාගාරය - සාමාජික
5) නියෝජිත, විගණකාධිපති දෙපාර්තමේන්තුව - සාමාජික
6) අධ්‍යක්ෂ (දැනුවත් කිරීම්), ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - සාමාජික
7) සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය), ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - සාමාජික
8) අභ්‍යන්තර විගණක, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - ලේකම්

සංවිධානය වෙත ලැබෙන විගණන විමසුම් සහ අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්තුමය වාර්තා මෙම කාරක සභාවේ රැස්වීම්වල සාකච්ඡා කරනු ලැබේ. තව දුරටත් විගණන විමසුම්වලට ලබා දී ඇති පිළිතුරුවල නිවැරදිභාවය සහ ඒවා නිවැරදි කිරීමට සංවිධානය විසින් ගෙන ඇති පියවරවල ඵලදායිත්වය ද සාකච්ඡා කෙරේ. පසුව එවන් විමසුම්වලට අදාළව ඒවා නිවැරදි කිරීමට ගත් පියවර පිළිබඳව සංවිධානයේ මාණ්ඩලික රැස්වීම්වල දී සාකච්ඡා කරනු ලැබේ. විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුමය රැස්වීම ලෙස පවත්වනු ලැබේ. මෙම කාරක සභාවල රැස්වීම් හතරක් සහ දෙකක් පිළිවෙලින් 2013 සහ 2014 වසරවල දී පවත්වන ලදී.

3.9 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය - 2014

2014 පෙබරවාරි 21 සිට මාර්තු 01 වැනි දින දක්වා කුලියාපිටියේ පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය තුළ ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රදර්ශන කුටියක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලදී.

වැඩසටහන	ඉලක්කගත කණ්ඩායම/ ස්ථානය
පුහුණු වැඩසටහන්, ප්‍රථමාධාර වැඩසටහන් (රතු කුරුස සංවිධානයේ සහභාගීත්වය සහිතව)	ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි පාසල් සිසුන් සහ මහජනතාව
පුත්තලම, කෑගල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ජංගම සේවා	ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරිවරු සහ අදාළ නිලධාරීන් ගේ සහභාගිත්වයෙන් එම ප්‍රදේශයේ පවතින ආපදාවලට අදාළ ගැටලු නිරාකරණය කිරීම.
අවදානම් සහිත ප්‍රදේශවල ස්ථානය කරන පුද්ගලයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.	කෑගල්ල දිස්ත්‍රික්කයේ දැන්වීම් පුවරු 20 ක් සවි කිරීම.

වගුව 3.1: 2014 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව සූදානම් වීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

3.10 ජාතික සුරක්ෂිත දිනය - 2014

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධානවල සහභාගිත්වයෙන් 2014 දෙසැම්බර් 26 දින ජාතික සුරක්ෂිත දිනය පවත්වන ලදි. ජාතික සුරක්ෂිත දිනය සංවිධාන කිරීමේ අරමුණ වන්නේ ආපදා නිසා ජීවිතක්ෂයට පත් වූ අය සිහි කිරීමත් සුරක්ෂිත සංස්කෘතියක් සහ පොදු ජනතාව, විශේෂයෙන්ම පාසල් දරුවන් අතර ආපදා අවදානම් අවබෝධය ඇති කිරීම ය. පාර්ලිමේන්තුවේ ගරු කථානායක චමල් රාජපක්ෂ මහතා ප්‍රධාන ආරාධිත වශයෙන් සහභාගි විය. ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ පාර්ශවකරුවන්

මෙම අවස්ථාවට පළක සහ ත්‍යාග ලබා දීමෙන් තම සම්පූර්ණ සහයෝගය ලබා දුන්හ. සුරක්ෂිත දින වැඩසටහන සම්පූර්ණ සජීව විකාශය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් සිදු කරන ලදී.

හම්බන්තොට පැවැත් වූ ප්‍රධාන ජාතික ආරක්ෂණ දිනයට සමගාමීව දිස්ත්‍රික්කය තුළ විවිධ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. ඒ අතර ගුරු, ශිෂ්‍ය, රාජ්‍ය නිලධාරි, පොලිස් නිලධාරි සහ හමුදා නිලධාරීන්හට පුහුණුවීම් ලබා දෙන ලදී. මෙම පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්වලට අමතරව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන සම්බන්ධීකරණ ඒකක විසින් ප්‍රාදේශීය මට්ටමේ ජාතික ආරක්ෂණ දින වැඩසටහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහයෝගීතාව සහිතව පවත්වන ලදී.



2014 දෙසැම්බර් 26 හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

3.11 ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය



3.12 හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව

හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව ස්වාභාවික ආපදාවක දී තම අදාළ සංවිධාන සමඟ කටයුතු කළ හැකි සහ සම්පත් ලබා දිය හැකි අත්‍යවශ්‍ය සේවාවන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර කටයුතුවලට සෘජුවම මැදිහත් වන පාර්ශවකාර නියෝජිතායතනවලින් සමන්විත වේ. කමිටුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සභාපතිත්වයෙන් නිරන්තරයෙන් රැස්වේ. මෙම කමිටුවේ ප්‍රධාන් යොමු කිරීම් අනුදේශ වනුයේ ආපදා අවස්ථාවන්හිදී හදිසි අවස්ථා ප්‍රතිචාර සම්බන්ධීකරණය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සහාය ලබාදීමත් ඕනෑම ව්‍යසනයකට මුහුණ දීම සඳහා ඔවුන්ව සූදානම් කරවීමත්ය. 2014 වසරේ හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටු රැස්වීම් තුනක් පවත්වා තිබේ.

3.13 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය (www.dmc.gov.lk)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය යවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම මෙම අංශයේ වගකීම වන අතර 2014 වසර තුළ මධ්‍යස්ථානය තුළ සිදු වූ සියලුම වැදගත් අවස්ථාවලට සම්බන්ධ තොරතුරු වෙබ් අඩවියට ඇතුළත් කර ඇති අතර සියලුම ආපදාවලට සම්බන්ධ තත්ත්ව වාර්තා වෙබ් අඩවියට දිනපතා ඇතුළත් කරයි. ඊට අමතරව ව්‍යාපෘති සම්බන්ධ සියලුම තොරතුරු www.drr.dmc.gov.lk වෙබ් අඩවිය හරහා අන්තර්ජාලයට ඇතුළත් කර තිබෙන අතර මෙම වසර තුළ වන ලිපි 12ක් වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර තිබේ.

3.14 ඩෙස් ඉන්වෙන්ටර් දත්ත පදනම (www.desinventar.lk)

පසුගිය ආපදාවලට සම්බන්ධ සියලුම තොරතුරු ඇතුළත් දත්ත බැංකුව www.desinventar.lk යන වෙබ් අඩවිය හරහා අන්තර්ජාලයට මුදාහැර තිබෙන අතර මෙම දත්ත පදනමට මරණ සංඛ්‍යාව, පීඩාවට පත් වූ සංඛ්‍යාව සහ හානියට පත් වූ දේපල පිළිබඳ විස්තර සහිතව සියලුම පසුගිය ආපදා සම්බන්ධයෙන් එම ආපදාවල ස්වභාවය අනුව තොරතුරු එම කාල සීමාවට අදාළව දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පදනමින් ඇතුළත් කර තිබේ. මෙම දත්ත පදනමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් ඒකකයේ තත්ත්ව වාර්තා සහ වන සංරක්ෂණය සහ සෞඛ්‍ය වැනි විෂයයන්ට අදාළ ආයතනවලින් ලබා ගන්නා තොරතුරු ද ඇතුළත් වේ. 1974 -2014 දක්වා කාලය තුළ සිදු වූ ආපදා සම්බන්ධ මූලික තොරතුරු ද මෙම දත්ත පදනමට ඇතුළත් කර තිබේ. පහත සඳහන් වගුවෙන් 2012, 2013 සහ 2014 යන වර්ෂවල සිදු වූ ආපදා සහ ඇතුළත් කර ඇති තොරතුරු ප්‍රමාණය දැක්වේ.

වර්ෂය	සිද්ධි සංඛ්‍යාව	දත්ත සංඛ්‍යාව
2012	16	512
2013	16	456
2014	13	456

වගුව 3.2: 2012, 2013 සහ 2014 යන වර්ෂවල සිදු වූ ආපදා සහ ඇතුළත් කර ඇති තොරතුරු ප්‍රමාණය

4. ආපදා අවම කිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය

4.1 පසුබිම

2004 ඇති වූ දරුණු සුනාමි තත්ත්වයෙන් පසුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආපදා අවම කිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය පිහිටුවීම තුළින් අපේක්ෂා කරන්නේ පශ්චාත් ආපදා කළමනාකරණ කටයුතුවලට වඩා පූර්ව ආපදා කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වන අතර ආපදා අවදානම් තක්සේරු කිරීම, ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති හඳුනාගැනීම ක්‍රියාත්මක කිරීම සහ ආරක්ෂිත ශ්‍රී ලංකාවක් තහවුරු කිරීමේ අරමුණ ළඟා කර ගැනීම

සඳහා කටයුතු කිරීම සහ ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමවේදයන් සංවර්ධනයේ ප්‍රධාන ධාරාවට සම්බන්ධ කරමින් තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීමයි.

4.2 දිස්ත්‍රික් මට්ටමේ ආපදා අවම කිරීම්

වගුව 3.3හි දක්වා ඇති පරිදි 2013 වසර තුළ සිදු වූ ආපදාවල දත්ත විශ්ලේෂණය කිරීම තුළින් පැහැදිලි වන කාරණය වන්නේ ජීවිත හානිවලට අමතරව යටිතල පහසුකම්වලට විශාල වශයෙන් අලාභ හානි වන බවයි.

ආපදා (සිද්ධි)	සිද්ධි සංඛ්‍යාව (2013)	මරණ සංඛ්‍යාව	නිවාස හානි
ගං වතුර	45	02	365
නියඟය	146	-	-
සුළි සුළං	219	68	9166
නායයෑම්	42	06	181

වගුව 4.1: දිස්ත්‍රික් මට්ටමේ ආපදා අවම කිරීම

වර්ෂය	වෙන් කරන ලද මුදල (රු. මිලියන)
2011	114
2012	122
2013	274
2014	500

වගුව 4.2: 2014 වසර සඳහා ලබා දුන් ප්‍රතිපාදන



සටහන 4.1: 2014 වසර සඳහා ලබා දුන් ප්‍රතිපාදන මූලාශ්‍රය - Desinventor

මෙම කරුණු සැලකිල්ලට ගෙන ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති වාර්තා සලකා බැලීමෙන් පසු රු. මිලියන 500ක් 2014 වසරේ ආපදා අවම කිරීමේ අංශයට මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති අතර එය පසුගිය වසරේ වෙන් කළ මුදල මෙන් දෙගුණයකි. (වගුව 4.2, සටහන 4.1)

<u>මෑත වර්ෂවල ආපදා අවම කිරීම සම්බන්ධයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන</u>

2013 ඇති වූ එක් එක් ආපදා සලකා බැලීමේ දී එම ආපදා විසින් සිදු කළ අලාභය සැලකිල්ලට ගෙන වෙන් කර ඇති මුදල් ප්‍රමාණය වගුව 4.2 සහ සටහන 4.1හි දක්වා ඇත. ආපදා අවම කිරීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන දිස්ත්‍රික්ක පදනමින් 4.3 වගුවේ දක්වා තිබේ.



සටහන 4.2: ආපදා අවම කිරීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන

ආපදා	2014 වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මිලියන)	%
ගං වතුර	324	77.8
නියඟය	90	18.2
සත්ව ප්‍රහාර	06	1.2
අස්ථාවර බෑවුම් ස්ථාවර කිරීම	14.2	2.8

වගුව 4.3: ආපදා අවම කිරීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන

<u>ආපදා අවම කිරීම සඳහා 2014 වසර වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන</u>



සටහන 4.3: ආපදා පදනම් මත ආපදා අවම කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

4.3 දිස්ත්‍රික් පදනම් මත ආපදා අවම කිරීම සඳහා 2014 වර්ෂයට ප්‍රතිපාදන වෙන් කිරීම

මෙම ව්‍යාපෘතිවල සමස්ත භෞතික ප්‍රගතිය 97%ක් පමණ වන අතර මූල්‍ය ප්‍රගතිය ද 97%ක ප්‍රමාණයක් දක්වා ළඟා වී තිබෙන අතර දිස්ත්‍රික්ක 17ක් පමණ වසර අවසානය වන විට දැඩි ගං වතුර තත්ත්වයන්ට මුහුණ දී තිබූ හෙයින් අපේක්ෂා කර තිබූ සම්පූර්ණ ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි වී තිබේ. ඒ අනුව මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ අවසන් අදියරේ තත්ත්වය පහත වගුවේ දක්වා තිබේ.

ක්‍රියාත්මකවන ව්‍යාපෘති - වැය ශීර්ෂය 2205		
අංකය	**ව්‍යාපෘතියේ නම**	**දිස්ත්‍රික්කය**
1	කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වැසි වතුර ගලා යාමට පහසුකම් සැලසීම සඳහා ධාරක බැම්ම ඉවත් කිරීම සඳහා කණින ලද අගල් පිරවීම	කිළිනොච්චි
2	මුරුක්කන් යෝධ ඇළ සහ මල්වතු ඔය හරහා ගං වතුර පාලනය	මන්නාරම
3	කඩවත, ඉහළ කරගහමුණ, මිහිඳු මාවතේ කඳු බෑවුම කඩා වැටීම වැළැක්වීම සඳහා පැති බැම්ම ඉදි කිරීම	ගම්පහ
4	කුඩා ඔය ගං වතුර පාලනය	බදුල්ල
5	කාණුපැලැල්ල සිට දුනුවංගිය (දළදා ඇළ) දක්වා ගංවතුර තත්ත්වය පාලනය කිරීම	බදුල්ල
6	ඉහළ අලුත් වැව පුළුල් කිරීම	බදුල්ල
7	කිඹුලන්ගෙන් ආරක්ෂා වීම සහ ගං වතුර පාලනය සඳහා කූඩු සකස් කිරීම	මාතර
8	564/බී, ඊ/ මූන්ගන්දළුව පිටවාන ඇල ප්‍රතිසංස්කරණය	පුත්තලම
9	යහන්ගල එෆ් සී 9 සී ඇලේ පැති බැම්ම සකස් කිරීම	හම්බන්තොට

වගුව 4.4: ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ අවසන් අදියරේ තත්වය



ගංවතුර පාලනය - ගාල්ල දිස්ත්‍රික්කය



ආරක්ෂිත නාන ස්ථානය - මාතර දිස්ත්‍රික්කය
(කිඹුලන්ගෙන් සිදුවන හිරිහැර අවම කිරීම)



නියහයේ බලපෑම අවම කිරීම සඳහා ළිං ඉදිකිරීම - මුලතිව් දිස්ත්‍රික්කය



නායයෑම් අවම කිරීම සඳහා ජල කාණු සකස් කිරීම - උඩුනුවර

හදිසි ආපදා සහන සඳහා රු. මිලියන 50ක් ලබා දී ඇති අතර මෙම ප්‍රතිපාදන අනතුරුදායක ලෙස ස්ථානගත වී තිබෙන අස්ථාවර ගල් ඉවත් කිරීම, නිවාසවලට හානි සිදුකරමින් හෝ යටිතල පහසුකම්වලට හානි සිදු කරමින් හෝ මාර්ග අවහිර කරමින් පෙරලුනු ගල් ඉවත් කිරීම, මාර්ග අවහිර කරමින් වැටුණ ගස් හෝ පස් ඉවත් කිරීම, වාහන ගමනාගමනට බාධා ඇති කරවන කුඩා පාලම් ප්‍රතිසංස්කරණය කිරීම, ආපදා අවස්ථාවල දී හානි සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ වෙනුවෙන් ඉන්ධන වියදම් හෝ කුළී ගෙවීම, හානි සිදුවිය හැකි තත්ත්වයේ තිබෙන වැව්වල බැම්ම සකස් කිරීම, ආපදාවලට ගොදුරුවූවන් ආරක්ෂිත ස්ථාන කරා ගෙන යාම, ආපදා බලපෑම් අවම කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම (උදලු, කැති ආදිය), පිරිසිදු ළිං සඳහා වතුර පොම්ප කුලියට දීම, ආපදාවල දී හානියට පත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ආදිය සඳහා භාවිත කර තිබේ. මේ වන විට මධ්‍යස්ථානයට රු. මිලියන 50ක පමණ ප්‍රතිපාදන ලැබී ඇති අතර හදිසි අවස්ථා තත්ත්වයන්හි දී දිස්ත්‍රික්ක මට්ටමින් ආයෝජනය කර තිබෙන ප්‍රතිපාදන ප්‍රමාණය 4.5 වගුවේ දක්වා තිබේ. මෙම වසර අවසානයේ පැමිණි දැඩි ගං වතුර තත්ත්වය නිසා ඇති වූ හදිසි ආපදා අවම කිරීම සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන ඒ සඳහා ප්‍රමාණවත් නොවුණි.

දිස්ත්‍රික්කය	වියදම (රු.)
මුලතිව්	500,000.00
පුත්තලම	1,334,539.50
කොළඹ	960,000.00
රත්නපුර	2,031,146.62
හම්බන්තොට	10,292,288.76
අනුරාධපුර	2,095,642.01
මහනුවර	4,047,070.00
ගාල්ල	1,118,500.00
කුරුණෑගල	500,000.00
මාතලේ	1,861,750.00
බදුල්ල	1,411,500.00
කෑගල්ල	1,568,331.02
නුවර එළිය	3,137,375.00
කළුතර	3,168,000.00
වව්නියා	500,000.00
ගම්පහ	2,082,000.00
යාපනය	3,260,000.00
කිලිනොච්චි	500,000.00
ත්‍රිකුණාමලය	3,996,250.00
මොනරාගල	27,000.00
පොළොන්නරුව	3,632,494.00
අම්පාර	970,000.00
මන්නාරම	500,000.00
මාතර	500,000.00
මඩකලපුව	1,000,000.00
එකතුව	**49,993,886.91**

වගුව 4.5: හදිසි අවස්ථා තත්වයන්ට දිස්ත්‍රික්ක මට්ටමින් ආයෝජනය කර තිබෙන ප්‍රතිපාදන ප්‍රමාණය



සටහන 4.4: හදිසි අවස්ථා තත්වයන්ට දිස්ත්‍රික්ක මට්ටමින් ආයෝජනය කර තිබෙන ප්‍රතිපාදන ප්‍රමාණය



හදිසි ප්‍රතිචාර - අනුරාධපුර



හදිසි ප්‍රතිචාර - නුවරඑළිය



හදිසි ප්‍රතිචාර - මාතර



හදිසි ප්‍රතිචාර - කළුතර

4.4 ගංවතුර පාලනය

4.4.1 පානදුර ගංවතුර පාලනය

පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සුළු වර්ෂාවකින් පසුවත් නාගරික ගංවතුර තත්ත්වයන්ට මුහුණ දෙන අතර මේ තත්ත්වය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකොට දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා ගත් අතර එම ව්‍යාපෘතිය වර්ෂ 03ක කාලයක් සඳහා 2012 වර්ෂයෙන් ආරම්භකොට රු. මිලියන 139ක වියදමින් සිදු කරයි. මෙම ව්‍යාපෘතියෙන් හඳුනාගත් කාරණය වන්නේ අනවසර පදිංචිකරුවන් ඇළ අවහිර කිරීමත් ඇළ නිසි පරිදි නඩත්තු නොකිරීමත් හේතුවෙන් මෝඩ ඇල සහ කැරපන් ඇළ අවහිරවීමෙන් මෙම ගං වතුර තත්ත්වය ඇතිවන බවයි. එම නිසා ඉහත ප්‍රතිපාදන යොදාගෙන කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහයෝගයත් සහිතව ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සැලසුම් අනුව ඇළ සංවර්ධනය කිරීමට පියවර ගෙන තිබේ. වසර තුනක කාලයකින් අවසන් කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 45ක මුදලක් 2014 වසර තුළ ලැබුණ අතර සමස්ත ව්‍යාපෘතියේ සැලසුම්ගත කටයුතුවලින් 75%ක පමණ වැඩ කොටසක් දැනටමත් අවසන් කර තිබේ. 2014 වසර සඳහා ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය 100%ක් වන අතර 2013 අවසන් කරන ලද වැඩ සඳහා ගෙවීම් කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොලැබුණ අතර 2014 වර්ෂය සඳහා ලැබුණ ප්‍රතිපාදන එම ගෙවීම්

කටයුතු සඳහා යෙදවීමට සිදුවිය. 2014 සඳහා යෝජනා කර තිබූ කටයුතුවලින් 75%ක් පමණ දැනට අවසන් වී තිබේ. කෙසේ වෙතත් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමේ දී ප්‍රජාවගෙන් මතුවන ගැටලු නිසා අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි වී තිබේ.



පෙර



පසු



පෙර



පසු

4.4.2 දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීම

මිරිස්ගෝනිය ඔය හා තම්මැන්නා ඇල අවහිර වීම නිසා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය, දඹුල්ල ආරෝග්‍ය ශාලාව, දඹුල්ල ගම් උදා භූමිය ඇතුළු සමාජීය සහ ආර්ථික වැදගත්කමකින් යුතු ස්ථාන ගණනාවක් වර්ෂිකව නාගරික ගංවතුර තත්ත්වයට ගොදුරු විය. මේ පිළිබඳව අවධානය යොමු කොට, ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තාව සැලකිල්ලට ගෙන, ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියක් සඳහා රු. මිලියන 60ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලද අතර මෙම ව්‍යාපෘතිය 2012 වසරේ සිට වසර 03ක කාලයක් ඇතුළත දී නිම කිරීමට සැලසුම්කොට ඇත. 2014 වසර සඳහා රු. මිලියන 20ක පමණ ප්‍රතිපාදන වෙන්කොට ඇති අතර 2013 වසරේ නිම කරන ලද කාර්යයන් සඳහා ගෙවීම් කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම නිසා 2014 වසරේ ප්‍රතිපාදන ඒ සඳහා යොදා ගැනීමට සිදු විය.

2014 වසර සඳහා සැලසුම් කොට ඇති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය 90%ක් පමණ වේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දහස් ගණනක් ජනතාව ඉන් සෘජු සහ වක්‍ර ප්‍රතිලාභ ලබන අතර 2012 වසරේ සිට මේ දක්වා මෙම ප්‍රදේශය අධික වැසි තත්ත්වයන් හිදී ගංවතුර

තත්වයන්ට ගොදුරු නොවීය. ආපදා හානි සිදු නොවීම සහනාධාර සඳහා ප්‍රතිපාදන වැය කිරීමට සිදු නොවීම, ජනතාවගේ ආර්ථික, සමාජීය සහ මානසික තත්ත්වයන් ස්ථාවරව පවත්වා ගැනීමට හැකි වීම යන ප්‍රබල කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය රටේ දළ ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීමට මෙන්ම රටෙහි සම්පත් සුරැකීමටද දායක වී ඇත.



දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීම

4.4.3 යාපනය ගංවතුර ආපදා අවම කිරීම

යාපනය දිස්ත්‍රික්කය තැනිතලා ප්‍රදේශයක් වන බැවින් වැසි ජලය බැස යාමේ සීඝ්‍රතාවය ඉතා පහළ මට්ටමක පවතී. මෙම ප්‍රදේශයේ වැසි ජලය කළමනාකරණය සඳහා තැන තැන ඉදිවූ කුඩා පොකුණු රාශියක් දැකිය හැකි නමුත් පසුගිය යුධ සමයේ පැවති වාතාවරණය හේතුවෙන් මෙම පොකුණු පද්ධතිය සහ වැසි ජලය බැස යාමේ පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවූ අතර ඒ හේතුවෙන් ගංවතුර ඇතුලු ස්වාභාවික ව්‍යසන රැසකට මෙම ප්‍රදේශයේ ජනතාවට මුහුණ පෑමට සිදු විය. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන, වසර 03ක කාලයක් සඳහා ආපදා අවම කිරීමේ අංශය මගින් යෝජනා කරන ලද ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 120ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කිරීමට මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා දෙන ලදී.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර 2012 සහ 2013 වර්ෂවල දී පිළිවෙලින් රු. මිලියන 12 ක සහ රු. මිලියන 35ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. එහෙත් 2013 වර්ෂය සඳහා සපයන ලද ප්‍රතිපාදන ප්‍රමාණය එම වසර තුළ සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් සඳහා ගෙවීම් සිදු කිරීමට ප්‍රමාණවත් නොවූ බැවින් 2014 වර්ෂය සඳහා වෙන් කරන ලද රු. මිලියන 50ක ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු. මිලියන 15ක මුදලක් 2013 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් සඳහා වන

ගෙවීම් සිදු කිරීමට භාවිත කරන ලදී. 2014 වසරේ මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ඉලක්කයන්ගෙන් 100% පමණ භෞතික ප්‍රගතියක් ළඟා කර ගෙන ඇති නමුත් සම්පූර්ණ කරන ලද වැඩ සඳහා ගෙවීම් සිදු කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබී නොමැත. මෙම ව්‍යාපෘතිය මගින් අති විශාල ජනතාවක් සෘජු හා වක්‍රාකාරයෙන් ප්‍රතිලාභ ලබා ඇත. කෙසේ වුව ද මෙම ප්‍රදේශයේ පවතින තාක්ෂණික නිලධාරීන්ගේ හිඟය සහ ප්‍රදේශයේ ජීවත් වන ජනවාර්ගික කණ්ඩායම් සම්බන්ධ කොටගෙන මෙම ප්‍රදේශය තුළ පවත්නා සමාජීය ගැටලු මගින් නිර්මාණය කරන ලද තත්ත්වයන් මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි බරපතල බලපෑමක් ඇති වී ඇත.



යාපනය - ගංවතුර ආපදා අවම කිරීම

4.5 ආපදා අවදානම අවම කිරීම, සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන ධාරාව තුළට ඒකාබද්ධ කිරීම

ආපදා තත්ත්වයන් විවිධ විෂය ක්ෂේත්‍රයන් හා බැඳී පවතින අතර එබැවින් තිරසාර සංවර්ධනයක් සඳහා ආපදා අවදානම අවම කිරීම අතිශය වැදගත් කරුණකි. මේ පිළිබඳ සැලකිල්ල යොමුකොට නිවාස ඉදිකිරීමේ දී ආපදා අවදානම අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් දැනුවත් කිරීම සහ පළාත් පාලන ආයතනවල තාක්ෂණික නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් ආසියානු ආපදා පෙර සුදානම් මධ්‍යස්ථානය හා එක්ව අදාළ පාර්ශවකාර ආයතන හා සහයෝගිතාවයෙන් සිදු කරමින් පවතියි. මෙම වැඩසටහන යටතේ පළාත් පාලන ආයතන 300ක පමණ නිලධාරීන් 650ක ප්‍රමාණයක් ආපදාවන්ට ඔරොත්තු දෙන නිවාස ඉදිකිරීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා පළාත් පාලන හා පුහුණු ආයතනය සමඟ කටයුතුකොට ඇති අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 75ක් පමණ පුහුණු කිරීමට ද සැලසුම්කොට ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන සඳහා මාර්ගෝපදේශකයන් සැලසීමට කටයුතුකොට ඇත. මීට අමතරව, එක්සත් ජාතින්ගේ ජනාවාස වැඩසටහන යටතේ ක්‍රියාත්මක සුරක්ෂිත නගර සඳහා සැලසුම් සැකසීමේ ව්‍යාපෘතිය යටතේ නාගරික සංවර්ධන සැලසුම් සඳහා මාර්ගෝපදේශයන් සකසා ඇත.

4.6 ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගීත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

දකුණු ආසියානු කලාපීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සහයෝගීත්වයෙන් ශ්‍රී ලංකාව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන "දකුණු ආසියානු කලාපීය දැනුම් ජාලය" යන තේමාවට සම්බන්ධ වෙබ් පිටුව යාවත්කාලීන කරනු ලබන අතර කලාපයේ අනෙකුත් රටවල ද සහභාගීත්වය සහිතව දකුණු ආසියානු කලාපීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනය මගින් "ආපදා හානි සහ පාඩු" යන මැයෙන් ඔක්තෝබර් මස තුළ දී වැඩමුළුවක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සුදානම් කෙරෙමින් පවතී.

තවද, ආපදා අවම කිරීම කළමනාකරණය කිරීමේ ක්‍රමෝපාය සඳහා වන එක්සත් ජාතින්ගේ ලේකම් කාර්යාලය හා සම්බන්ධව පවතින "හියෝගෝ ක්‍රියාකාරිත්වය සඳහා වන රාමුව" පරිදි පසුගිය වසර දෙක සඳහා ප්‍රගති වාර්තාව මෙම අංශය මගින් පිළියෙල කොට ඇති අතර "හියොගෝ ක්‍රියාකාරිත්වය සඳහා වන රාමුව" දියත් කිරීමෙන් අනතුරුව දියත් කිරීමට නියමිත "2015න් පසු" වැඩසටහන සඳහා යෝජිත තේමාවන් 07 යටතේ ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවයන් හඳුනාගනිමින් තවත් වාර්තාවක් ද පිළියෙල කොට ඇත. මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන තවත් ප්‍රධාන ක්‍රියාකාරකමක් වනුයේ "අපට අවශ්‍ය වන අනාගතය" යන තේමාව යටතේ අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන "2015න් පසු" වැඩසටහන හා සම්බන්ධිතව "හදිසි මෙහෙයුම් සහ පෙරසූදානම් වීම" පිළිබඳව වැඩමුළුවක් පැවැත්වීමයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ඉඩම් අමාත්‍යාංශය හා එක්ව ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව පරිදි, GFDRR හි සහයෝගිත්වය සහිතව ශ්‍රී ලංකාව සඳහා තොරතුරු හුවමාරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ සැලසුම් පිළියෙල කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සහ අදාළ පාර්ශවකාර ආයතනවල සහභාගීත්වය සහිතව අදාළ ක්‍රියාකාරකම් සඳහා වැඩමුළුවක් පැවැත්වීම ද මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් ක්‍රියාකාරකම් අතර වේ.

වසර ආරම්භයේ දී ඉලක්ක කරන ලද සියලුම වැඩසටහන් ආරම්භකොට ඇති අතර දැනට ක්‍රියාත්මකව පවතී. ප්‍රමාණවත් පුහුණු මානව සම්පත් නොමැති වීම සහ අරමුදල් හිඟය ආදිය මෙහි අපේක්ෂිත ඉලක්ක අත්පත් කර ගැනීමේ දී පවතින ප්‍රධාන අවහිරතාවයන් වේ.

5. දැනුවත්කිරීමේ අංශය

5.1 හැඳින්වීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැනුවත් කිරීමේ අංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය, ආපදා අවදානම් පාත්‍රතාවය සහිත ප්‍රජාවන්, රජය සහ රාජ්‍ය නොවන පාර්ශවකරුවන්, අධ්‍යාපන ආයතන, පාසල් ගුරුවරුන්, පාසල් සිසුන් සහ අනෙකුත් කණ්ඩායම් සඳහා පුහුණු සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ වගකීම දරයි. පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවය සහිතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් වැඩසටහන් කිහිපයක් සංවිධානය කිරීම සහ පැවැත්වීම සිදු වේ.

5.2 2014 වර්ෂය සඳහා අරමුදල් වෙන් කිරීම

2014 වර්ෂය සඳහා නිලධාරීන්ගේ සහ මහජනතාවගේ ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමට රු. මිලියන 12.5ක මුදලක් ලැබී ඇත. දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් සඳහා 2012, 2013 සහ 2014 වර්ෂවල දී ලැබුණු අරමුදල් සහ 2015 වර්ෂය සඳහා වෙන් කරන ලද අරමුදල් අතර සංසන්දනයක් 5.1 සටහන තුළ දක්වා ඇත.



සටහන 5.1 - 2012 සිට 2015 වසර දක්වා ලැබුණු / වෙන් කරන ලද අරමුදල් පිළිබඳ සංසන්දනයක්



සටහන 5.2 ජාතික - දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් අතර අරමුදල් බෙදී යාම - 2014

2014 වර්ෂය සඳහා ලැබුණු ප්‍රතිපාදන භාවිත කරන ලද්දේ ජාතික, දිස්ත්‍රික්, කොට්ඨාස සහ ග්‍රාමීය මට්ටම් දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමටයි. දැනුවත් කිරීමේ අංශය මගින් ජාතික මට්ටමේ වැඩසටහන් සංවිධානය කළ අතර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මගින් දිස්ත්‍රික්, කොට්ඨාස සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සංවිධානය කරන ලදී. ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සඳහා අරමුදල් බෙදීයාම 5.2 සටහන තුළ පැහැදිලිකොට දක්වා ඇත.

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මගින් දිස්ත්‍රික් මට්ටමේ පුහුණු සහ ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා සාපේක්ෂව ඉතා විශාල මුදලක් වියදම් කරන ලදි. ඒ අනුව දිස්ත්‍රික්ක 25 සඳහා රු. මිලියන 8.50 ක් ලබා දී ඇති අතර ආපදා සඳහා අරමුදල් බෙදී යාම 5.3 සටහන තුළ විස්තරකොට දක්වා ඇත.



සටහන 5.3: වෙන් කරන ලද ප්‍රතිපාදන /දිස්ත්‍රික්ක

<u>දිස්ත්‍රික්ක වෙත සපයන ලද අරමුදල් පිළිබඳ සංසන්දනය - 2014</u>

2013 වර්ෂය සමග සංසන්දනය කිරීමේ දී අරමුදල් වෙන් කිරීම්වල ඉහළයාම හා සමගාමීව දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 2014 වර්ෂය තුළ වැඩි වී තිබුණි. 2012, 2013 හා 2014 වර්ෂයන්වල දී පවත්වන ලද දැනුවත් කිරීමේ සහ පුහුණු ක්‍රියාකාරකම් සංඛ්‍යාව පිළිබඳ සංසන්දනයක් 5.4 සටහන තුළින් ඉදිරිපත් කෙරේ.



සටහන 5.4: 2012 වසරේ සිට 2014 වසර දක්වා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු ක්‍රියාකාරකම් පිළිබඳ සංසන්දනයක්

5.3 ජාතික මට්ටමේ වැඩසටහන්

5.3.1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා ජාතික මට්ටමේ ධාරිතා වර්ධන වැඩසටහන්

අදාළ දිස්ත්‍රික්කවල ආපදා ඇතිවීමේදී ආපදාවට පෙර ආපදාව අතරතුර සහ ආපදාවෙන් පසුව ගත යුතු වන ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය කේන්ද්‍ර කරමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් විසින් වඩා සාධනීය ප්‍රතිචාර දැක්වීමේ තත්ත්වයක් සඳහා ඔවුන්ගේ ධාරිතා වර්ධනය වෙනුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පුහුණු කිරීමේ කටයුතු සිදුකොට ඇත. 2014 වසරේ දී එවන් පුහුණු වැඩසටහන් පවත්වන ලද්දේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරුන්, කළමනාකරණ සහකාරවරුන්, ඇමතුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය, කාර්යාල කාර්ය සහායකවරුන් සහ රියදුරන් වෙනුවෙනි.



සහකාර අධ්‍යක්ෂවරුන්, කළමනාකරණ සහකාරවරුන් සහ රියදුරන් සඳහා පුහුණු වැඩසටහන

5.3.2 පාර්ශවකරුවන්ගේ ධාරිතා වර්ධනය

අදාළ පාර්ශවකාර ආයතනයන්ගේ ආපදා කළමනාකරණ හැකියාව ඉහළ නැංවීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් අරමුදල් වෙන් කරන ලද අතර 2014 වර්ෂය තුළ දී පහත වැඩසටහන් හා රැස්වීම් පවත්වන ලදී.

- ගුවන් හමුදා නිලධාරීන් සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන්
- බන්ධනාගාර නිලධාරීන් සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන්
- බංගලාදේශ කණ්ඩායම සඳහා දින භාගයේ දැනුවත් කිරීමේ වැඩසටහන
- බංගලාදේශ ආපදා කළමනාකරණ වෘත්තියවේදීන් සඳහා දින භාගයේ දැනුවත් කිරීමේ වැඩසටහන
- ගුවන් හමුදා නිලධාරීන් සඳහා එක් දින පුහුණු වැඩසටහන්
- නාවික හමුදා නිලධාරීන් සඳහා එක් දින පුහුණු වැඩසටහන්
- ටෙලිකොම් ආයතනයේ නිලධාරීන් සඳහා එක් දින පුහුණු වැඩසටහන්



ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන් සහ වෙනත් රජයේ නියෝජිත ආයතන සඳහා පුහුණු වැඩසටහන්

5.4 පළාත් මට්ටමේ වැඩසටහන්

5.4.1 පළාත් මට්ටම තුළ පාර්ශවකරුවන්ගේ ධාරිතා වර්ධනය

දිස්ත්‍රික් සහ කොට්ඨාස මට්ටම තුළ පවතින ආපදා කළමනාකරණ ක්‍රියාවලියට දායක වෙමින් පාර්ශවකාර ආයතනවල දිස්ත්‍රික් සහ කොට්ඨාස මට්ටමේ සාමාජිකයන්ගේ ධාරිතාව වඩා ශක්තිමත් කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැනුවත් කිරීමේ අංශය මගින් අරමුදල් වෙන් කරන ලදී. අදාළ ප්‍රාදේශීය සීමාවන් තුළ ඇතිවනු ලබන සියලුම ආකාරයේ ආපදා සහ ආපදා කළමනාකරණ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ වැඩසටහනට ඇතුළත් විය. ඒ අනුව, DDMCU මගින් අදාළ දිස්ත්‍රික්කවල පාර්ශවකරුවන් සඳහා පහත ධාරිතා වර්ධන වැඩසටහන් පවත්වන ලදී.

- සෑම දිස්ත්‍රික්කයකටම එකක් වන පරිදි දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් 25ක්
- යාපනය, මන්නාරම, මහනුවර, කිලිනොච්චි, කෑගල්ල, කොළඹ, ගාල්ල, මාතර, පොළොන්නරුව හා අනුරාධපුර දිස්ත්‍රික්කවල මාධ්‍යවේදීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක්

- පුත්තලම, මහනුවර, කළුතර, ත්‍රිකුණාමලය සහ මුලතිව් දිස්ත්‍රික්කයන්හි පොලිසිය සහ හමුදා නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 5ක්
- රජයේ නිලධාරීන් සඳහා කොට්ඨාස මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 50ක් (එක් දිස්ත්‍රික්කයක 2ක් බැගින්)



පොලීසිය හමුදාව හා රජයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්

5.4.2 පළාත් පාලන ආයතනයන්ගේ ධාරිතා වර්ධනය

පළාත් පාලන ආයතන සතු බලතල සහ කාර්යභාරයන් සැලකීමේ දී එම ආයතන, ආපදා කළමනාකරණ ක්‍රියාවලියට සහාය සැලසිය හැකි ඉතා සාධනීය ව්‍යුහයක් වන බැවින්, පළාත් පාලන ආයතනයන්ගේ සාමාජිකයින් සහ නිලධාරීන් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. 2014 වසරේ දී වැඩසටහන් 48ක් පවත්වන ලදි.



පළාත් පාලන ආයතනයන්ගේ සාමාජිකයන් සහ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන

5.4.3 සිද්ධි විධාන පද්ධතිය (Incident Command System – ICS)

යාපනය, වවුනියාව, අනුරාධපුරය සහ කොළඹ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල කාර්ය මණ්ඩල, රජයේ නිලධාරීන් දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරුන් සඳහා ICS පුහුණු වැඩසටහන් තුනක් පවත්වන ලදී.



5.4.4 ආගමික ප්‍රජාවගේ ධාරිතා වර්ධනය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැනුවත් කිරීමේ අංශය මගින් 2014 වර්ෂයේදී ආගමික ප්‍රජාවගේ ධාරිතා වර්ධනය සඳහා අරමුදල් වෙන් කරන ලදී. කුරුණෑගල, කෑගල්ල, ගම්පහ, කළුතර, රත්නපුර, ගාල්ල, බදුල්ල, මොනරාගල, අම්පාර සහ වවුනියා දිස්ත්‍රික්කවල ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක ඔස්සේ ආගමික ප්‍රජාව සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් දහයක් පවත්වන ලදී.



ආගමික ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

5.4.5 බරපතල ආපදා අවදානමක් පවතින ප්‍රදේශයන්හි කාන්තාවන්ගේ ධාරිතා වර්ධනය

යාපනය, මන්නාරම, කුරුණෑගල, නුවරඑළිය, මාතලේ, බදුල්ල, මොනරාගල, වවුනියාව, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල බරපතල ආපදා අවදානමක් පවතින ප්‍රදේශයන්හි කාන්තාවන්ගේ ධාරිතා වර්ධනය සඳහා විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් පවත්වන ලදී.



කාන්තාවන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන - අම්පාර දිස්ත්‍රික්කය

5.5 පාසල් ගුරුවරුන් සහ පාසල් සිසුන් සඳහා පුහුණු වැඩසටහන්

මුල සිටම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් පාසල් ගුරුවරුන් අඛණ්ඩව පුහුණු කරන ලදී. 2014 වර්ෂය තුළ දී පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් 50ක් ද පාසල් සිසුන් සඳහා පුහුණු වැඩසටහන් 55ක් ද පවත්වන ලදී.



පාසල් ගුරුවරුන් සහ පාසල් සිසුන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්

5.6 ආපදා කළමනාකරණ ග්‍රාමීය කමිටුවල ධාරිතා වර්ධනය

ග්‍රාමීය මට්ටම තුළ ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ ග්‍රාමීය කමිටු ස්ථාපිතකොට ඇති අතර පහතින් විස්තර කොට ඇති පරිදි කමිටු සාමාජිකයන්ගේ ධාරිතා වර්ධනය සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී.

- ප්‍රථමාධාර සහ කඳවුරු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් 55
- රත්නපුර, මාතර, හම්බන්තොට, පොළොන්නරුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල බෝට්ටු හැසිරවීම පිළිබඳ පුහුණු වැඩසටහන් 5ක්
- ගාල්ල, හම්බන්තොට, මාතලේ, මඩකලපුව සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳ පුහුණු වැඩසටහන් 5ක්



ප්‍රථමාධාර සහ බෝට්ටු හැසිරවීම පිළිබඳ පුහුණු වැඩසටහන

5.7 ස්වේච්ඡා කණ්ඩායම් ස්ථාපිත කිරීම

ආපදා කළමනාකරණ ජාතික සභාවේ තීරණය පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් යුක්තව පාසල් ස්වේච්ඡා කණ්ඩායම් 15ක් ස්ථාපිත කරන ලදී. 2013 වර්ෂයේදී දිස්ත්‍රික්ක 25 තුළ පාසල් ස්වේච්ඡා කණ්ඩායම් 25ක් ස්ථාපිත කරන ලදී. 2014 වර්ෂයේ දී පාසල් ස්වේච්ඡා කණ්ඩායම් විසිපහක් සහ යොවුන් ස්වේච්ඡා කණ්ඩායම් 24ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ සහයෝගීත්වයෙන් ස්ථාපිත කරන ලදී.



යොවුන් හා පාසල් ස්වේච්ඡා කණ්ඩායම් ස්ථාපිත කිරීම

5.8 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටු සාමාජිකයන්ගේ ධාරිතා වර්ධනය

ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටු (NDMCC) මගින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් හා සමගාමීව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටු සාමාජිකයන්ගේ ධාරිතා වර්ධනය හා දැනුම වැඩිදියුණු කිරීම සඳහා 2014 වර්ෂයේ දී අරමුදල් වෙන් කරන ලදී. 2014 වර්ෂයේ දී එවන් පුහුණු වැඩසටහන් දිස්ත්‍රික්ක 25ම පවත්වන ලදී.

5.9 ජාතික සහ ප්‍රාදේශීය ප්‍රදර්ශන තුළින් මහජනතාව දැනුවත් කිරීම

පහත සඳහන් දිස්ත්‍රික්කවල දැයට කිරුළ ප්‍රදර්ශනය පැවැත්වීම ද ඇතුළුව ජාතික, ප්‍රාදේශීය සහ පාසල් මට්ටමේ ප්‍රදර්ශන භාවිත කරමින් ආපදාවන්ගේ විවිධ පැතිකඩ පිළිබඳව රටෙහි ජනතාව දැනුවත්කොට ඇත.

- කොළඹ
- ගම්පහ
- කුරුණෑගල
- හම්බන්තොට
- අනුරාධපුර



ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රදර්ශන කුටියක් - කොළඹ

5.10 ජංගම රථ යොදාගනිමින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම



මහජනතාව අතර ආපදා කළමනාකරණය පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ජංගම රථ යොදාගෙන ඇත. 2014 වර්ෂය තුළ දී බරපතල ආපදා අවදානමක් පවතින ප්‍රදේශ වෙත විශේෂ අවධානය යොමු කරමින් ගම්පහ, කළුතර, කුරුණෑගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. පානදුර, ලීඩ්ස් ජාත්‍යන්තර පාසලේදී ජංගම රථය මගින් පාසල් සිසුන් දැනුවත් කිරීම සිදු කරන ලදී.

5.11 දැනුවත් කිරීම සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය මුද්‍රණය කිරීම

මහජනතාව, පාර්ශවකරුවන්, පාසල් සිසුන් සහ අනෙකුත් පුද්ගලයන් අතර දැනුවත්භාවය නිර්මාණය කිරීම සඳහා පත්‍රිකා, කෙටි චිත්‍රපට, සී.ඩී / ඩී.වී.ඩී තැටි, සිතියම්, සැලසුම්, කුඩා පොත් පිංච සහ මොඩියුල වැනි පුහුණු කිරීමේ සහ මහජනතාව දැනුවත් කිරීමේ ද්‍රව්‍ය සැකසුම් කිරීම සහ මුද්‍රණය කිරීම සඳහා දැනුවත් කිරීමේ අංශය වගකිව යුතු පහතින් දක්වා ඇති ද්‍රව්‍ය සැකසුම්කොට ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ප්‍රදර්ශන දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හා වෙනත් වැඩසටහන් ඔස්සේ බෙදා හරින ලදී.



මුද්‍රණය කරන ලද සී. ඩී. ඩී. සහ වෙනත් ද්‍රව්‍ය

5.12 විදේශීය පුහුණු සහ වැඩමුළු

රට තුළ ආපදා කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී විදේශීය දැනුම පිළිබඳ අත්දැකීම් ලබාගැනීම ජාත්‍යන්තර සංවිධාන සහ ආයතන සමඟ සම්බන්ධතා පැවැත්වීම ඉතාම වැදගත් වේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්ට ජාත්‍යන්තර සංවිධාන මගින් නේපාලය, ඉන්දියාව, තායිලන්තය, ස්විට්සර්ලන්තය, මාලදිවයින, ඉන්දුනීසියාව, බංගලාදේශය, කොරියාව, චීනය, ඔස්ට්‍රියාව, හවායි සහ පිලිපීනය වැනි රටවල පවත්වන ලද පුහුණු වැඩමුළු සම්මන්ත්‍රණ සහ සම්මේලනයන්ට සහභාගී වීමට අවස්ථා හිමි විය.

6. පෙර සූදානම් සැලසුම් අංශය

6.1 හැඳින්වීම

ජාතික ව්‍යසන කළමනාකරණ සැලසුම් නිර්මාණය කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම, දිස්ත්‍රික්, කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ආපදා පෙර සුදානම් සහ හදිසි ප්‍රතිචාර සැලසුම් පිළියෙල කිරීම සඳහා සහාය වීම සහ පෙරහුරු වැඩසටහන් සහ ප්‍රජා මූලික ආපදා කළමනාකරණ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම යනාදිය පෙර සුදානම් සැලසුම් අංශයේ මූලික කටයුතු වේ. එසේම 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත මගින් නියම කරනු ලැබ ඇති පරිදි ව්‍යසන කළමනාකරණ සැලසුම් නිර්මාණය කිරීම සඳහා සියලුම රාජ්‍ය අංශයේ ආයතනයන්ට සහ දිස්ත්‍රික්ක, කොට්ඨාස අවදානම් පාත්‍රතාවය සහිත ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ රාජ්‍ය අංශයේ සංවිධාන ආදියට සහාය සැලසීම ද මෙම අංශයෙන් සිදු වේ. ගංවතුර, නායයාම්, සුනාමි සහ සුළිකුණාටු ආදී ශ්‍රී ලංකාව තුළ නිතරම ඇතිවන උවදුරු සඳහා ආපදා පෙර සූදානම් සැලසුම් කටයුතු සිදු කිරීම ද ආපදා

කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සුදානම් සැලසුම් අංශය මගින් සිදු කරනු ලබන සැලසුම් කටයුතුවලට අයත් වේ.

2014 වර්ෂයේදී දිස්ත්‍රික්ක 25 පෙර සූදානම් සැලසුම් ක්‍රියාකාරකම් සඳහා රු. 9,228,000/- ක මුදලක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් වෙන්කොට ඇත. පවත්නා ආපදා කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙමින් දිස්ත්‍රික්කවලට වැඩසටහන් සඳහා මෙම අරමුදල් නිකුත් කොට ඇත.

දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ආපදා කළමනාකරණ යාන්ත්‍රණය සවිමත් කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සුදානම් සැලසුම් අංශය දිස්ත්‍රික්කක සඳහා විවිධ පෙර සුදානම් සැලසුම් කටයුතු සඳහා අරමුදල් වෙන් කරන ලදී. පාර්ශවකරුවන්ගේ, ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීමේ වැඩමුළු සහ ප්‍රත්‍යාස්ථ නගර වැඩසටහන සඳහා සැලසුම් මුද්‍රණය කිරීම යනාදිය සඳහා අරමුදල් ප්‍රදානය කොට ඇත. ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් අරමුදල් ලබා දෙන ලද වැඩසටහන් වනුයේ සුනාමි, ගංවතුර සහ නායයාම් පෙරහුරු අභ්‍යාස, උවදුරු සිතියම්ගත කිරීම, අවදානම් පාත්‍රතාවය විශ්ලේෂණය කිරීම, ග්‍රාමීය මට්ටමේ කමිටු නිර්මාණය කිරීම වැනි ප්‍රජා මූලික CBDR වැඩසටහන් පැවැත්වීම, වේලි කැඩී යාම මගින් ඇති වන හදිසි අවස්ථාවල දී ගංඟා පහළ ප්‍රදේශයේ අවදානම් පාත්‍රතාවය සහිතව සිටින ප්‍රජාව සඳහා පෙර සූදානම් සැලසුම් පිළියෙල කිරීම යනාදියයි.



සටහන 6.1: මුදල් වෙන් කිරීම

වර්ණ අනුව දැක්වීම,

- දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලසුම් සංශෝධනය කිරීම
- කොට්ඨාස මට්ටමේ මූලික වැඩමුළු
- කොට්ඨාස මට්ටමේ අවසන් වැඩමුළු

- ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම
- පෙරහුරු, දැනුවත් කිරීම සහ උවදුරු සිතියම්ගත කිරීම
- වේලි සඳහා හදිසි ප්‍රතිචාර සැලසුම්
- දිස්ත්‍රික් මට්ටමේ ආපදා කළමනාකරණ කමිටු රැස්වීම්
- දියේ ගිලීම් අවම කිරීම
- කොට්ඨාස මට්ටමේ ආපදා කළමනාකරණ සැලසුම් මුද්‍රණය කිරීම
- ප්‍රත්‍යාස්ථ නගර වැඩසටහන

<u>විවිධ ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම</u>

6.2 ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පවත්වන පෙරහුරු අභ්‍යාස

2014 වර්ෂය තුළ දී, ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පෙරහුරු අභ්‍යාස 307ක් පවත්වා ඇති අතර, රට තුළ බරපතල සුනාමි අවදානමක් සහිත දිස්ත්‍රික්ක 14ක සුනාමි අවස්ථාවල දී ඉවත්වීම පිළිබඳ පෙරහුරු අභ්‍යාස පවත්වා ඇත. සමස්තයක් වශයෙන් බරපතල සුනාමි අවදානමක් සහිත දිස්ත්‍රික්ක 14ක පෙරහුරු අභ්‍යාස 247ක් පවත්වා ඇත. එයට අමතරව, නායයාම් සහ ගංවතුර පිළිබඳ අධික අවදානමක් පවතින දිස්ත්‍රික්කයන්හි ග්‍රාම නිලධාරී කොට්ඨාසවල නායයාම් පිළිබඳ පෙරහුරු අභ්‍යාස 23කුත්, ගංවතුර පිළිබඳ පෙරහුරු අභ්‍යාස 39කුත් පවත්වා ඇත. 2014 වර්ෂයේ දී, ස්වාභාවික ආපදා සම්බන්ධයෙන් සුරක්ෂිතතාව සහතික කිරීම සම්බන්ධයෙන් අවදානම් පාත්‍රතාව සහතික කිරීම සම්බන්ධයෙන් අවදානම් පාත්‍රතාව සහිත ප්‍රජාවට සහ සමස්ත ජාතියටම දැනුවත් කිරීම සඳහා ජාතික පෙරහුරු වැඩසටහන් පවත්වා ඇත. 2014 වර්ෂයේ දී පෙරහුරු අභ්‍යාස සඳහා රු. 3,590,000/-ක මුදලක් වැය කොට ඇත.



සටහන 6.2: දිස්ත්‍රික්ක තුළ පවත්වන ලද සුනාමි පෙරහුරු අභ්‍යාස පිළිබඳ සාරාංශය




සුනාමි අවස්ථාවලදී ජනතාව ඉවත් කිරීමේ පෙරහුරු වැඩසටහන - හම්බන්තොට

සුනාමි පෙරහුරු අභ්‍යාසයන් පැවැත්වීමට අමතරව, ගංවතුර සහ නායයෑම් පිළිබඳ බරපතල අවදානමක් සහිත ප්‍රදේශවල අවදානම් පාත්‍රතාවය සහිත ප්‍රජාවගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ පාර්ශවකරුවන්ගේ සහාය සහිතව ගංවතුර සහ නායයෑම් පිළිබඳ පෙරහුරු අභ්‍යාස ද පවත්වන ලදී.

දිස්ත්‍රික්කය	ගංවතුර පෙරහුරු	නායයාම් පෙරහුරු	මුදල් වෙන් කිරීම
මහනුවර	01	03	40,000.00
නුවරඑළිය		05	50,000.00
බදුල්ල	01	04	50,000.00
කෑගල්ල		04	40,000.00
රත්නපුර	06	01	70,000.00
කුරුණෑගල	03		30,000.00
අනුරාධපුර	04		40,000.00
පොලොන්නරුව	03		30,000.00
මොනරාගල	02	01	30,000.00
මන්නාරම	01		10,000.00
වවුනියාව	04		40,000.00
ගම්පහ	05		50,000.00
මුලතිව්	01		10,000.00
කිලිනොච්චිය	01		10,000.00
වවුනියාව	04		40,000.00
හම්බන්තොට	01		10,000.00
ගාල්ල	01		10,000.00
මාතර	01		10,000.00
එකතුව	39	23	620,000.00

වගුව 6.1: 2014 වර්ෂය තුළදී පවත්වන ලද ගංවතුර සහ නායෑයාම් පෙරහුරු අභ්‍යාස




නුවරඑළිය දිස්ත්‍රික්කයේ පොල්වතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පවත්වන ලද නායයෑම් පෙරහුරු අභ්‍යාසය

6.3 විශාල ජලාශ වේලි ආශ්‍රිත ආපදා සම්බන්ධයෙන් පෙර සුදානම් කටයුතු

සුළිකුණාටු, අධික වර්ෂාව අතරතුර දී හෝ භූ චලනයක් හේතු කොටගෙන ජලාශ වේලි ආශ්‍රිතව ආපදා ඇතිවීමට ඇති ඉඩකඩ සැලකිල්ලට ගනිමින්, තෝරාගත් ප්‍රධාන ජලාශ වේලි පාමුල ජීවත් වන ප්‍රජාවන්ගේ පෙර සූදානම් හැකියාව ඉහළ නැංවීමේ වැඩසටහන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ආරම්භ කරන ලදී. SAR, ප්‍රථමාධාර, කඳවුරු කළමනාකරණය සහ ගමෙහි ආරක්ෂාව පිළිබඳ උපකමිටු ස්ථාපිත කරමින් ගංහා වේලි ආශ්‍රිතව ජීවත්වන අවදානම් පාත්‍රතාවයේ සිටින ප්‍රජාවන් සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන්, ආපදා පෙරසූදානම් ව්‍යාප්ත කිරීමේ යාන්ත්‍රණ වැඩිදියුණු කිරිම, ගංවතුර බලපෑමට ලක්වන ප්‍රදේශ සිතියම් ගත කිරීම, සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම සහ අවසාන වශයෙන් ආරක්ෂිත ස්ථාන වෙත ඉවත්වීමේ පෙරහුරු අභ්‍යාස පැවැත්වීම පිළිබඳ වැඩසටහන්වලින් මෙය සමන්විත විය.





රත්නපුර දිස්ත්‍රික්කයේ සමනල වැව ප්‍රදේශයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පොල්වතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පවත්වන ලද වේලි ආශ්‍රිත ආරක්ෂාව පිළිබඳ වැඩසටහන

දිස්ත්‍රික්කය	මුදල් වෙන් කිරීම (රු.)	වැඩසටහන
පොළොන්නරුව	45,000.00	03
අනුරාධපුරය	90,000.00	06
නුවරඑළිය	105,000.00	07
මහනුවර	90,000.00	06
අම්පාර	15,000.00	01
බදුල්ල	45,000.00	03

මාතලේ	30,000.00	02
රත්නපුර	45,000.00	03
කුරුණෑගල	45,000.00	03
පුත්තලම	30,000.00	02
මඩකලපුව	30,000.00	02
කළුතර	30,000.00	02
මුලතිව්	30,000.00	02
කිලිනොච්චිය	15,000.00	01
වවුනියාව	15,000.00	01
හම්බන්තොට	45,000.00	03
එකතුව	705,000.00	47

වගුව 6.2: දිස්ත්‍රික්කවල පවත්වන ලද වේලි ආශ්‍රිත ආරක්ෂාව පිළිබඳ වැඩසටහන්වල සාරාංශය

6.4 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලසුම් වැඩි දියුණු කිරීම

ආපදාවක් සිදුවුවහොත් හෝ ආපදාවක් සිදුවන අවස්ථාවක දී ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම සඳහා සහාය වන කාර්යසාධක ලේඛනයක් ලෙස ආපදා පෙරසූදානම් සැලැස්ම හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කයක් තුළ සිදුවන ආපදාවන් සඳහා ප්‍රතිචාර දක්වන ඉහළම කළමනාකාරිත්ව ආයතනය ලෙස දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව හැඳින්විය හැකිය. මෙම කමිටුවේ සහ උප කමිටුවල සාමාජිකයන් සහ ඔවුන්ගේ කාර්යභාර්යන් සහ වගකීම් මෙම සැලැස්ම තුළ අන්තර්ගත වේ. පරිපාලන ප්‍රදේශය, පවතින උවදුරු, අවදානම් තත්වවල ප්‍රතිඵල සහ සිදු කරන ලද අවදානම් තත්ත්ව තක්සේරු කිරීම, ප්‍රධාන ස්ථාන පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ආකාරය, ප්‍රදේශය තුළ පවත්නා භෞතික හා මානව සම්පත්, ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණය හා සම්බන්ධ විවිධ පාර්ශ්වකාර ආයතනවල වගකීම් පිළිබඳ තොරතුරු මෙම සැලසුම් තුළ අන්තර්ගත වේ.

2014 වසරේ දෙසැම්බර් අවසානය වන විට දිස්ත්‍රික්, ආපදා කළමනාකරණ සැලසුම් 25ක් සකස් කිරීම අවසන් කොට ඇත. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලසුම් 11ක් සංශෝධනය කොට නව තොරතුරු සමඟින් මුද්‍රණය කොට පාර්ශ්වකරුවන් අතර බෙදා හැර ඇත.

6.5 ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලසුම්

2014 වර්ෂය සඳහා වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදනය යටතේ ප්‍රාදේශීය ආපදා පෙර සූදානම් සැලසුම් පිළියෙල කිරීම සිදු කරන ලදී. ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම ඇරඹීම සඳහා සහ ඒවා හඳුන්වා දීම සඳහා මූලික වැඩමුළු 24ක් පවත්වන ලදී. ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලසුම්වල අවසාන කෙටුම්පත් පාර්ශවකාර ආයතන වෙත පිරිනැමීම සඳහා වැඩමුළු 48ක් පවත්වන ලදී.




ප්‍රාදේශීය මට්ටමේ ආපදා පෙර සුදානම් වැඩසටහන - වව්නියාව

ඊට අමතරව, සැලසුම් 44ක් මුද්‍රණයකොට පාර්ශවකරුවන් අතර බෙදා හරින ලදී. ප්‍රාදේශීය මට්ටමේ ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම සඳහා රු. 2,161,000/- ක මුදලක් වැය කොට ඇත.

දිස්ත්‍රික්කය	වැඩමුළු සංඛ්‍යාව	ආරම්භක වැඩමුළුව	වැඩමුළු සංඛ්‍යාව	අවසන් වැඩමුළුව
කොළඹ				මහරගම, ජයවර්ධනපුර, කෝට්ටේ
ගම්පහ				
ගාල්ල	1	හික්කඩුව	3	ඉමදුව, හබරාදුව. බද්දෙගම
මාතර	2	කිරින්ද / පිටබැද්දර	1	අතුරලිය
මහනුවර	2	පාතහේවාහැට /පාතදුම්බර	3	මිනිපේ, තුම්පනේ, අකුරණ
මාතලේ	2	නාවුල/රත්තොට	1	නාඋල
කෑගල්ල			6	යටියන්තොට, වරකාපොල, ගලිගමුව, මාවනැල්ල, කෑගල්ල, රඹුක්කන
රත්නපුර			2	ඉඹුල්පේ, කිරිල්ල
කුරුණෑගල			8	ඉබ්බාගමුව මහව, උඩුබද්දාව, අඹන්පොල ගල්ගමුව වාරියපොල, කොටවෙහෙර, කුලියාපිටිය
අනුරාධපුර	1	පලුගස්වැව		
පොලොන්නරුව				
මන්නාරම			2	මඩු සහ මන්නාරම
පුත්තලම			2	පල්ලෙගම, ආණමඩුව
ත්‍රිකුණාමලය	3	සේරුවිල, මුතුර් කන්තලේ		
මඩකලපුව			1	KPW D S

අම්පාර			1	දඹාන
මොනරාගල				
යාපනය	4	වංකර්නි, කරෙයිනගර්, සන්දිලිපේයි, වේලනෙකයි	4	කයිට්ස්, පේදුරුතුඩුව, මරදන්කර්නි, වංකර්නි
මුලතිව්	4		4	
කිලිනොච්චි	1	කිලිනොච්චි	2	කරච්චි පියොනන්රි
වවුනියාව	2	වවුනියාව දකුණ සහ උතුර	2	වවුනියාව දකුණු සහ උතුර
හම්බන්තොට		තංගල්ල		
කළුතර			4	පාලින්ද නුවර, බුලත්සිංහල මිල්ලනිය, මදරාවල
එකතුව	**24**		**48**	

වගුව 6.3: ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම වෙනුවෙන් පවත්වන ලද දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැඩමුළු

6.6 ග්‍රාමීය ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම

ගම්මානවල පවතින විවිධ උවදුරු සැලකිල්ලට ගනිමින්, ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ආපදා කළමනාකරණ සැලසුම් 192ක් සකසා නිමකොට ඇත. ප්‍රජා සහභාගිත්වය සහ ප්‍රජා මට්ටමේ ආපදා සිතියම් ගත කිරීම ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ සැලසුම් ක්‍රියාවලියේ ප්‍රධාන කටයුතු වේ. තවද, ප්‍රජා මට්ටමේ උවදුරු සිතියම්ගත කිරීම, ඉවත් වීම සඳහා ආරක්ෂිත මාර්ග, ආරක්ෂිත ස්ථාන හඳුනාගැනීම, ප්‍රථමාධාර අභ්‍යන්තරිකව අවතැන්වුවන් සඳහා කඳවුරු ස්ථාපනය කිරීම සහ කඳවුරු කළමනාකරණය කිරීම පිළිබඳව ද ඔවුනට පුහුණුව ලබා දෙන ලදී.




වව්නියා දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ පෙර සුදානම් සැලසුම් ක්‍රියාකාරකම්

6.7 ප්‍රත්‍යාස්ථ නගර වැඩසටහන

UNISDR හි ප්‍රතිපාදන මත මෙම වැඩසටහන ප්‍රධාන අදියර දෙකකින් යුතුව ආරම්භ කරන ලදී. එනම් පළාත් පාලන ආයතන මගින් ප්‍රත්‍යාස්ත නගර වැඩසටහන සඳහා අත්සන් තැබීම (දියත් කිරීමේ අදියර) සහ පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම (ක්‍රියාත්මක කිරීමේ අදියර) වේ. මේ සඳහා "කරුණු දහයක පිරික්සුම් ලැයිස්තුවක්" සහ දේශීය පාර්ශවකරුවන් විසින් හියෝගෝ ක්‍රියාකාරී රාමුව (HFA) ක්‍රියාත්මක කිරීම සඳහා වන මාර්ගෝපදේශ ලබා දී ඇත.

නාගරික ආපදා අවදානම් අඩු කිරීම සහ පුරවැසියන්ගේ යහපත වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන ආරම්භ කරන ලද ප්‍රත්‍යාස්ථ නගර වැඩසටහන් යාපනය මහ නගර සභාව (වැඩමුළු 1), ගම්පොල නගර සභාව (2) පුත්තලම නගර සභාව (2) සහ පානදුර නගර සභාව (2) වශයෙන් පවත්වන ලදී. ප්‍රාදේශීය ප්‍රජාවන් බිම් මට්ටමේ සිට ජාතික බලධාරීන් සමඟ වැඩකටයුතු සිදු කිරීමට පළාත් පාලන ආයතනයන්ට දැනුවත් කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ.

6.8 රට තුළ දියේ ගිලීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම

ශ්‍රී ලංකාව තුළ දියේ ගිලීම නිසා සිදු වී යැයි වාර්තා වන මරණ සංඛ්‍යාව වැඩි වීමේ නැඹුරුවක් පසුගිය වසර කිහිපය තුළ ඇති වී ඇත. මෙම වැඩසටහනේ අරමුණ වනුයේ අවදානම් පාත්‍රතාවය ඉහළ ප්‍රදේශවල සංඥා පුවරු පිහිටුවීම සහ එමඟින් අනතුරුදායක පොකුණු, ගංගා සහ වැව් තුළ දිය නෑම සිදු නොකරන ලෙස ජනතාව දැනුවත් කිරීම වේ. මෙම සංඥා පුවරු කොළඹ, ගාල්ල, ගම්පහ, කළුතර, අම්පාර, හම්බන්තොට, රත්නපුර, මොනරාගල, මාතර, අනුරාධපුර, පොලොන්නරුව, ත්‍රිකුණාමලය, බදුල්ල, මහනුවර, හා මඩකලපුව දිස්ත්‍රික්කවල ස්ථාපිත කොට ඇත.



දියේ ගිලීම් අවම කිරීම සඳහා ප්‍රදර්ශනය කොට ඇති සංඥා පුවරු

6.9 පෙර සූදානම් සැලසුම් අංශය විසින් සිදු කරනු ලබන විශේෂ ව්‍යාපෘති

"දැයට කිරුළ" ජාතික වැඩසටහනට සමගාමීව, කුරුණෑගල, කෑගල්ල සහ පුත්තලම දිස්ත්‍රික්කවල ආපදා පෙර සුදානම් සැලසුම් ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සඳහා පෙර සූදානම් සැලසුම් අංශය මගින් විශාල සේවයක් සිදු කොට ඇත. ආපදා අවදානම අවම කිරීමේ වැඩසටහන සඳහා වන අරමුදල් සහ වෙනත් තාක්ෂණික සහාය ඉහළ නංවා ඇත. ප්‍රදර්ශන පරිශ්‍රය තුළ වෙනම කුටියක් නිර්මාණය කොට තිබූ අතර මෙම ප්‍රදර්ශනය පුරාවටම දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.



2014 - කුලියාපිටියේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනය

7. හදිසි මෙහෙයුම් අංශය

7.1 හැඳින්වීම

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය 2006 වර්ෂයේ දී පිහිටුවන ලද අතර එය සතියෙහි දින 07 සිට පැය 24 පුරාවටම ක්‍රියාත්මක වේ. සිදුවීමට ඉඩ ඇති ආපදා පිළිබඳව තාක්ෂණික ආයතන වෙතින් පූර්ව අනතුරු ඇඟවීමේ තොරතුරු හදිසි මෙහෙයුම් අංශය වෙත ලැබෙන අතර එම තොරතුරු අදාළ ප්‍රතිග්‍රාහකයන් වෙත ව්‍යාප්ත කිරීමත්, එම තත්ත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීමත් මෙමඟින් සිදු කෙරේ. රට පුරා සිදුවන ස්වාභාවික ආපදා සහ මිනිසාගේ මැදිහත් වීමේ සිදුවන විපත් පිළිබඳව සියලු තොරතුරු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් එකතුකොට දෛනික තත්ත්ව වාර්තාවක් පිළියෙල කරනු ලැබේ.

මෙම වාර්තාව අතිගරු ජනාධිපතිතුමන් ආපදා කළමනාකරණ අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම් සහ සියලුම මාධ්‍ය හා පාර්ශවකාර ආයතන වෙත යොමු කරනු ලැබේ. ස්වාභාවික හෝ මිනිසාගේ මැදිහත්වීමෙන් සිදුවන ආපදාවක දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ත්‍රිවිධ හමුදා, පොලීසිය, ගිනි නිවීම් ඒකක සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන්ගේ සහය සහිතව, මුදවා ගැනීමේ

මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, සම්පත් යෙදවීම සහ හදිසි සහන සැලසීමේ සේවා සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබේ. මෙම මධ්‍යස්ථානය, කොළඹ 07, විද්‍යා මාවතේ පිහිටි නව ගොඩනැගිල්ලේ දියුණු පහසුකම් සහිතව ක්‍රියාත්මක වේ.




7.2 ප්‍රධාන ආපදාවල දී හදිසි ප්‍රතිචාර දැක්වීම

7.2.1නියඟයෙන් බලපෑමට පත් ජනතාව

2014 වසරේ ජූලි සිට සැප්තැම්බර් දක්වා කාල සීමාව තුළ නියඟය හේතුවෙන් දිස්ත්‍රික්ක 17ක් තුළ බලපෑමට ලක් වූ මුළු පුද්ගලයන් සංඛ්‍යාව 1495082ක් විය. පානීය ජලය ලබාදීම සඳහා හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක සමඟ සම්බන්ධීකරණය වන අතර බලපෑමට පත් වූ පවුල් වෙත සාධනීය අයුරින් ජලය බෙදා දීම සහතික කිරීම සඳහා ට්‍රැක්ටර් බවුසර් සපයනු ලැබීය.

7.2.2 ගංවතුර හේතුවෙන් බලපෑමට පත් ජනතාව

2014 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ ජලගැලීම් හේතුකොට ගෙන විපතට පත් වූ සම්පූර්ණ පුද්ගලයින් සංඛ්‍යාව 1171988ක් විය. දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක මඟින් සහාය ඉල්ලා සිටින අවස්ථාවල දී හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය පොලිසිය සහ සන්නද්ධ හමුදා සමඟ සම්බන්ධ වී මුදවා ගැනීම, ජනතාව ආරක්ෂිත ස්ථාන කරා ඉවත් කිරීම සහ හදිසි සහනාධාර මෙහෙයුම් සිදු කිරීමට ක්‍රමයක් පිහිටුවනු ලැබේ. බලපෑමට ලක් වූ පවුල් ආරක්ෂිත මධ්‍යස්ථානවල දී නිසි පරිදි රැකබලා ගනු ලබන බවට සහතික කිරීම සඳහා අවශ්‍ය ආහාර හා අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයීමට හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය වේ.

7.2.3 නායයෑම් සහ බෑවුම් කඩා වැටීම

2014 වර්ෂයේ දී අධික වර්ෂාපතනයක් සමඟ නායයෑම් සහ බෑවුම් කඩා වැටීමේ සිද්ධි 08ක් ද, මරණ 30ක් ද වාර්තා වී ඇත. අධික වර්ෂාවක් සමඟ නායයෑම් ඇති වීමේ අවදානමක් පවතින ස්ථානවල සිට ආරක්ෂිත ප්‍රදේශ කරා ඉවත් වන ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මාධ්‍ය මඟින් මහජනතාවට උපදෙස් දෙන ලදී. මෙම ප්‍රදේශ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා දැනුවත්

කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී. හදිසි අනතුරක් ඇති විය හැකි අවස්ථාවක නායයෑමේ අවදානම සහිත ප්‍රදේශවලින් ජනතාව ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් විස්තීර්ණ සැලැස්මක් සකසා ඇත.




2014 ඔක්තෝබර් මස 29 වන දින බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති වූ මීරියබැද්ද නායයෑම - මුදවාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක ව පවතී

7.2.4 දැඩි සුළං ආපදා

2014 වර්ෂයේදී දැඩි සුළං ඇතිවීමේ සිද්ධි 56ක් සහ මරණ 2ක් වාර්තා වූ අතර ඉන් පුද්ගලයින් 13907කට බලපෑම් ඇති විය. මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, මාර්ග එළි පෙහෙලි කිරීම, සන්නිවේදන සහ විදුලිබල සැපයීම් ප්‍රතිස්ථාපනය කිරීම, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සහාය ඇතිව පීඩාවට පත් ජනතාවට සහන ලබා දීම යනාදිය සිදු කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට හැකි විය. මෝසම් කාලය ආරම්භ වීමට ප්‍රථම තම නිවාස අවට ඇති ගස් හා අතු කපා ඉවත් කරගන්නා ලෙසට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මාධ්‍ය මගින් ජනතාවට උපදෙස් දෙන ලදි.

7.2.5 ගංවතුර සහ අනෙකුත් ආපදා පිළිබඳව වන හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා අවශ්‍ය වන හදිසි අවස්ථා උපකරණ මිලට ගැනීම

විවිධ වර්ගයේ ආපදා පිළිබඳ විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව හදිසි මෙහෙයුම් වැය ශීර්ෂය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් හදිසි අවස්ථා ප්‍රතිචාර උපකරණ මිලදී ගන්නා ලදී. දම්වැල් කියත් 15ක්, ජල ටැංකි සහිත ට්‍රැක්ටර් 09ක්, එන්ජීම සහිත බෝට්ටු 09ක්, බෝට්ටු රැගෙන යා හැකි ට්‍රෙලර් 03ක්, විදුලි උත්පාදන යන්ත්‍ර 20ක් (කි.වො. 2), තිත් ආලෝක පන්දම් 150ක්, ජීවිත ආරක්ෂක කබා 300ක්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කබා 8571ක්, වතුර මෝටර් 600ක් සහ අගුල් 45ක් මෙයට ඇතුළත් විය.

7.2.6 ලැව්ගිනි / ගිනි උවදුරු ආපදාවලදී හදිසි ප්‍රතිචාර

2014 වර්ෂය තුළ ලැව්ගිනි සිදුවීම් 167ක් වාර්තා වී ඇත. ලැව්ගිනිවල දී දේපල, පරිසරය මෙන්ම ජනතාවට ඉතා විශාල පරිමාණයේ හානි සිදුවීම වැළැක්වීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ගම්වැසියන්ගේ සහාය සහිතව ලැව්ගිනි පාලනය කිරීම සඳහා ගුවන් හමුදා, යුධ හමුදා සහ පොලිසියේ නිලධාරීන් යොදවන ලදී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව පවතින සාධනීය

සන්නිවේදන ජාලය හේතුවෙන් පොලිසිය ගුවන් හමුදාව සහ යුධ හමුදාවෙන් කඩිනමින් සහාය ලබාගැනීමට හදිසි මෙහෙයුම් අංශයට හැකි විය.

7.2.7 අකුණු සැර වැදීම

2014 වර්ෂය තුළ අකුණු සැර වැදීමේ සිද්ධි 21කුත්, මරණ 21කුත් වාර්තා වී ඇත. අකුණු ගැසීම් සිදුවන අවස්ථාවල ආරක්ෂිත ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මාධ්‍ය ඔස්සේ ජනතාවට උපදෙස් දී ඇත. අකුණු ගැසීමේ භයානක ස්වරූපය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී.

7.3 2014 වසර තුළ සිදුවූ ආපදා සිදුවීම් සහ අලාභ හානි

සිදුවීම	මරණ	තුවාල වීම්	අතුරුදහන් වීම්	නිවාස විනාශ වීම	නිවාසවලට අලාභ හානි සිදුවීම	බලපෑමට පත්වීම	බලපෑමට ලක් වූ පවුල් සංඛ්‍යාව
රිය අනතුරු	0	0	0	0	5	21	5
සත්ව පහරදීම්	7	1	0	0	0	0	0
වෙරළ තීරයේ අනතුරු	0	0	0	1	36	710	170
බෑවුම් ඉවුරු ආදිය කඩා වැටීම	3	4	0	5	23	556	140
නියඟය	0	0	0	0	0	1495082	494011
දියේ ගිලීම	20	4	1	0	0	0	0
ගිනි උවදුරු	1	5	0	104	33	555	129
හදිසි ගංවතුර	0	0	0	0	0	4	21
ගංවතුර	34	32	3	4875	15217	1171988	317080
නායයෑම්	30	5	31	72	147	13848	3791
අකුණු සැර	21	8	0	0	18	76	21
වැසි	0	0	0	43	318	5578	1667
ආරක්ෂිත බැම් අනතුරු	0	0	0	0	1	4	1
ගල් පෙරලීම්	0	0	0	3	7	50	12
තද සුළං	2	21	0	206	3648	13907	4142
ගිලා බැසීම්	0	0	0	0	33	130	33
සැඩ පහර	0	0	0	3	0	15	3
ගස් පෙරලී වැටීම	1	0	0	0	14	42	11
එකතුව	**119**	**80**	**35**	**5312**	**19500**	**2702566**	**821237**

වගුව 7.1: 2014 වර්ෂය තුළ ආපදා හේතුවෙන් සිදුවූ ජීවිත අහිමි වීම්, තුවාල වීම් සහ අලාභහානි පිළිබඳ සාරාංශය මූලාශ්‍රය : Desinventor

7.4 හදිසි මෙහෙයුම් අංශය මඟින් සිදු කරන වෙනත් හදිසි පෙර සූදානම් කටයුතු

7.4.1 පූර්ව දැනුම්දීම් විසුරුවා හැරීම

සන්නිවේදන පහසුකම්වල සිදු කරන ලද වැඩි දියුණු කිරීම් පිළිබඳ විස්තර පහතින් විස්තර කොට ඇත. "ආපදා කළමනාකරණ සන්නිවේදන සහ ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩි දියුණු කිරීම" පිළිබඳ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 25ක් ජනසතුකොට පූර්ව අනතුරු ඇඟවීම් විසුරුවා හැරීමේ ජාලයට එක් කොට ඇත. සම්පූර්ණ වශයෙන් කුළුණු 77ක් ජනසතු කොට ඇත. හික්කඩුව, ගාල්ල හා පේදුරුතුඩුව ප්‍රදේශවල නියමු පදනමකින් ස්ථාපිත කරන ලද පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු වෙනුවට නව කුළුණු තුනක් ද ජනසතු කරන ලදී. පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණුවලට හඬ පහසුකම ලබා දීම රේඩියෝ සන්නිවේදනය ඔස්සේ සිදු කරන ලද අතර සෑම බ්‍රහස්පතින්දා දිනකම පෙ.ව.10ට පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු පරීක්ෂාවට ලක් කිරීම සිදු වේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ, දිස්ත්‍රික් ඒකකවල සහ ග්‍රාමීය මට්ටමේ කමිටුවල පූර්ව අනතුරු ඇඟවීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සිය ප්‍රමුඛතාවය ලබා දී ඇත.

7.4.2 අන්තර් රාජ්‍ය ජාලය-Intra Government Network

ඩයලොග් ආයතනයේ සහාය සහිතව අන්තර් රාජ්‍ය ජාල (IGN) ක්‍රමය යළි ස්ථාපනය කරන ලදී. එය තාක්ෂණික ආයතන, මාධ්‍ය සහ පොලිසිය සමඟත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පූර්ව හදිසි අවස්ථා මෙහෙයුම් අංශය සමඟත් සම්පූර්ණයෙන්ම සම්බන්ධව පවතී. මෙම ආයතන 14 අතර බාධාවීම්වලින් තොර සන්නිවේදනයක් සහතික කිරීම සඳහා මෙම පද්ධතිය සතුව එයටම වෙන් වූ සන්නිවේදන මාර්ගයක් පවතී.

7.4.3 ශ්‍රී ලංකා ආපදා සම්පත් ජාලය (SLDRN)

ශ්‍රී ලංකා ආපදා සම්පත් ජාලය (SLDRN) යනු එක් එක් දිස්ත්‍රික්කය තුළ හදිසි අවස්ථාවක දී භාවිත කිරීම සඳහා පවතින සම්පත් පිළිබඳ දත්ත ගබඩාවකි. මෙම දත්ත ගබඩාව හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය මඟින් කාර්තුවකට වරක් යාවත්කාලීන කරනු ලැබේ.

7.4.4 සුනාමි අවස්ථාවලදී ජනතාව ආරක්ෂිත ස්ථාන කරා ඉවත් කිරීම පිළිබඳ පෙරහුරු වැඩසටහන්

වෙරළබඩ ප්‍රජාවන් ආපදාවල දී සූදානමින් පසුවීම සහ ඔවුන්ගේ ආරක්ෂාව ඉහළ තත්ත්වයකට ගෙන ඒම සඳහා සුනාමි ඉහළ අවදානම් පාත්‍රතාවයක් පවතින දිස්ත්‍රික්ක 14ක් ආවරණය කරමින් 2014 වසරේ ජනවාරි, අප්‍රේල් සහ දෙසැම්බර් මාසවල දී සුනාමි අවස්ථාව දී ජනතාව ආරක්ෂිත ස්ථාන කරා ඉවත් කිරීම පිළිබඳ ජාතික මට්ටමේ පෙරහුරු වැඩසටහන් හතරක් පවත්වා ඇත. (කොළඹ, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය, මන්නාරම, හම්බන්තොට, මාතර, මුලතිව්, කළුතර, අම්පාර, ගාල්ල, යාපනය, පුත්තලම, ගම්පහ, මඩකලපුව)

මෙම අභ්‍යාසයේ පරමාර්ථය වූයේ පෙර සුදානම් මට්ටම සහතික කර ගැනීම, පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියේ විශ්වාසනීයභාවය පරීක්ෂා කිරීම සහ අනතුරු ඇඟවීම් විසිරුවාලීමේ සාධනීයභාවය පරීක්ෂා කිරීමයි. කාර්තුමය වශයෙන් සිදු කරන ක්‍රියාවක් වශයෙන් මෙම ජාතික මට්ටමේ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම, ක්‍රියාපටිපාටිය තුළ සහ සුනාමි අවදානම දරන ප්‍රජාවන්ගේ දැනුවත්භාවය තුළ පවත්නා හිඩැස් හඳුනාගැනීමටත් එමෙන්ම මහජනතාව ඉවත් කිරීමේ ක්‍රියාපටිපාටි වැඩිදියුණු කිරීමටත් ඉතා වැදගත් වේ. 2010 වසරේ දී මෙහි මූලික අවදිය තුළ ප්‍රජාවන් ආරක්ෂිත ස්ථාන කරා ඉවත් කිරීමට පැය 1 විනාඩි 40ක් ගත වූ නමුත් 2014 වර්ෂයේ දී දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රජාවන් ආරක්ෂිත ස්ථාන කරා ඉවත් කිරීමට ගත වූයේ සාමාන්‍ය වශයෙන් විනාඩි 35ක් පමණි.



සුනාමි අවස්ථාවල දී ඉවත් කිරීමේ පෙරහුරු අභ්‍යාස - මහජනතාව අතර ඉවත් කිරීමේ ක්‍රියාපටිපාටි වැඩි දියුණු කිරීම

7.4.5 ඇමතුම් මධ්‍යස්ථානය

ඇමතුම් මධ්‍යස්ථානයක් ස්ථාපිතකොට ඇති අතර එය නව ගොඩනැගිල්ල තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා වන හදිසි දුරකථන අංකය වශයෙන් 117 වෙන්කොට ඇති අතර මහජනතාවට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමග සන්නිවේදනය කිරීම සඳහා එයට ම වෙන් වූ දුරකථන මාර්ගයක් ස්ථාපිතකොට ඇත. ඇමතුම් ක්‍රියාකරුවන් 21 දෙනෙක් බඳවා ගනු ලැබූ අතර දැනට මෙම ඇමතුම් මධ්‍යස්ථානය සතියේ දින 7ට පැය 24 පුරා ම ක්‍රියාත්මක වේ.



පැය 24 x 7 - ඇමතුම් මධ්‍යස්ථානය

7.4.6 VHF සංඛ්‍යාතයන් ඔස්සේ සියලුම පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු සඳහා හඬ පණිවුඩ ලබාදීමේ පහසුව ස්ථාපිත කිරීම

වෙරළබඩ ප්‍රදේශයන්හි ස්ථාපිතකොට ඇති කුළුණු 77 ඔස්සේ අවදානම් පාත්‍රතාවයේ සිටින ප්‍රජාවන් වෙත පූර්ව අනතුරු ඇඟවීමේ පණිවුඩ විකාශය කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් සියලු පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු මත VHF සන්නිවේදන පද්ධති ස්ථාපනයකොට ඇත.

7.4.7 කෙටි පණිවිඩ ව්‍යාප්ත කිරීමේ යාන්ත්‍රණය (SMS)

සතියේ දින 07 පුරාම පැය 24 පදනමකින් ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය සහ මාධ්‍ය ක්ෂේත්‍රය තුළ සිටින ප්‍රධාන පාර්ශවකරුවන් / නිලධාරීන් හට අනතුරු ඇඟවීම් සිදු කිරීම සඳහා DEWN පද්ධතිය භාවිත කරමින් කෙටි පණිවිඩ ව්‍යාප්ත කිරීමේ යාන්ත්‍රණය ඔස්සේ ආපදා ආශ්‍රිත අනතුරු ඇඟවීම් සහ දෛනික කාලගුණ අනාවැකි නිකුත් කිරීමේ කටයුත්ත ස්ථාපනයකොට ඇත. DEWN පද්ධතියේ නවතම සංස්කරණය 2014 දෙසැම්බර් 26 වන දින සාර්ථකව එළි දක්වන ලදී.



7.4.8 හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව

2014 වර්ෂය තුළ දී ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේදී හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටු රැස්වීම් 03ක් පවත්වන ලද අතර එහිදී රසායනික අනතුරු සම්බන්ධයෙන් සූදානමින් පසුවීම සහ ශ්‍රී ලංකාවේ වර්තමාන රසායනික අනතුරු, පූර්ව අනතුරු ඇඟවීම් ව්‍යාප්ත කිරීම සහ මාධ්‍යවල දායකත්වය පිළිබඳව සාකච්ඡා කරන ලදී. ඉදිරියේ දී සිදුවිය හැකි විවිධ අනතුරු සම්බන්ධයෙන් ප්‍රතිචාර කටයුතු සිදු කිරීම සඳහා හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුවේ පාර්ශවකරුවන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සහාය වනු ඇත.

7.4.9 ඩෙංගු මර්දන වැඩසටහන

2014 වර්ෂය තුළ දී ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මගින් සෞඛ්‍ය නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, ගුරුවරුන්, පාසල් සන්නද්ධ හමුදා සහ පොලිසිය සමඟ සහයෝගයෙන් පළාත්, දිස්ත්‍රික්

හා ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටම් තුළ ඩෙංගු මර්දන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ඒවා සංවිධානය කිරීම සඳහා සහාය වීම සිදුකොට ඇත.

7.4.10 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම (NEOP)

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත මගින් ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම (NEOP) සඳහා විධිවිධාන සලසයි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් (NEOP) ක්‍රියාවලිය දියත් කරන ලද්දේ ශ්‍රී ලංකා UNDP වැඩසටහනේ මූල්‍ය සහ තාක්ෂණික සහාය සහිතවයි. NEOP යනු, හදිසි අවස්ථා මෙහෙයුම් සඳහා වන පුළුල් සැලැස්මක් වන අතර එය සිදු කරනුයේ ජාතික සහ ප්‍රාදේශීය මට්ටම් තුළ සහ අදාළ පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය සහ හදිසි අවස්ථා ප්‍රතිචාර යාන්ත්‍රණ නිසි පරිදි සිදු කිරීම මගිනි.

කෙටුම්පත් කළ ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම (NEOP) පිළිබඳ කටයුතු අවසන්කොට එය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ආපදා ප්‍රතිචාර මෙහෙයුම්වලට සම්බන්ධ වී සිටින ආයතන සහ පුද්ගලයන්ගේ ධාරිතාවයන් වැඩි දියුණු කිරීම සඳහා වන නියමු ව්‍යාපෘතිය දියත් කරන ලද්දේ NEOP කෙටුම්පතට අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීමටත් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාකොට ඒ පිළිබඳ කටයුතු සමාප්ත කිරීමත් සඳහා ය. වැඩිදුර අදහස් ලබා ගැනීම සඳහා පාර්ශවකරුවන්ගේ වගකීම් www.dmc.gov.lk/neopl වෙබ් අඩවියේ දක්වා ඇත.

7.4.11 ආපදා කළමනාකරණය සඳහා වන සිද්ධි විධාන පද්ධතිය (ICS) පිළිබඳ අන්තර් - මධ්‍ය පුහුණු පාඨමාලාව

සිද්ධි විධාන පද්ධතිය පිළිබඳව අවබෝධයක් මෙමඟින් ලබා දීම, ප්‍රධාන විධාන තනතුරුවල වගකීම් අවබෝධ කරවීම, ICS වැඩමුළු පැවැත්වීම සඳහා සහ දිස්ත්‍රික් මට්ටමේ පුහුණු කිරීම් සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්පත්දායක කණ්ඩායමක් නිර්මාණය කිරීම යනාදිය සිදු වේ. උතුරු පළාතේ අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් නියෝජනය කරමින් එක් එක් දිස්ත්‍රික් ලේකම්වරුන් යටතේ සිද්ධි කළමනාකරණ කණ්ඩායමක් IMT ස්ථාපිත කරන ලදී. යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල නිලධාරීන්ගේ මොඩියුල යාපනය, චුන්ඩිකුලම් හිදී 2014 ජුනි 17 සිට 20 දක්වා පවත්වන ලද අතර, මන්නාරම, මුලතිව් හා වවුනියා දිස්ත්‍රික්කවල නිලධාරීන්ගේ මොඩියුල 2014 ඔක්තෝබර් 28සිට 31 දක්වා අනුරාධපුරයේ දී පවත්වන ලදී.



මන්නාරම, මුලතිව් සහ වව්නියා දිස්ත්‍රික් සහභාගීත්වය



යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික් සහභාගීත්වය

7.4.12 ශ්‍රී ලාංකීය නගර සඳහා ආපදා ප්‍රත්‍යාස්ථ නගර සංවර්ධනය කිරීම හා උපාය මාර්ග

ශ්‍රී ලාංකිය නගර සඳහා ආපදා ප්‍රත්‍යාස්ථ නගර සංවර්ධනය කිරීම හා උපාය මාර්ග පිළිබඳ ව්‍යාපෘතියක් UNHABITAT හි අරමුදල් සැපයීමෙන්, අම්පාර, මුලතිව්, මන්නාරම හා වවුනියාව දිස්ත්‍රික්කවල පවත්වන ලදී. රේඩියෝ උපකරණ සහ වෙනත් හදිසි කළමනාකරණ ක්‍රියාකාරකම් භාවිතය පිළිබඳ ග්‍රාමීය මට්ටමේ කමිටු පුහුණු කිරීම හා ඒවා ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කරන ලදී. පූර්ව අනතුරු ඇඟවීමේ උපකරණ මිලදී ගැනීම දැනටමත් අවසන් කොට ඇති අතර ප්‍රත්‍යාස්ථ නගර ප්‍රදේශයන්හි ජීවත් වන අවදානම් පාත්‍රතාවය සහිත ප්‍රජාවන් බෙදා හැර ඇත.

දිස්ත්‍රික් මට්ටම දක්වා VHF සන්නිවේදන පහසුකම් සපයා ඇති අතර අවදානම් පාත්‍රතාවය සහිත තෝරාගත් ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමට ව්‍යාප්ත කරනු ලැබේ. සන්නිවේදන උපකරණ හැසිරවීම සඳහා ග්‍රාමීය මට්ටමේ ප්‍රජාවන් පුහුණු කරන ලදී. අක්කරේපත්තු, මුලතිව්, වවුනියාව හා මන්නාරම යන ප්‍රදේශවල සමස්තයක් වශයෙන් VHF සන්නිවේදන කට්ටල 16ක් සවිකොට ඇත.

7.4.13 2015 වර්ෂයේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.11.4) විදෙස් අරමුදල්

හදිසි අවස්ථා ප්‍රතිචාර පුහුණුව අවසන් කළ යුතුය. (අක්කරේපත්තු, මුලතිව්, වවුනියාව සහ මන්නාරම ප්‍රජා සාමාජිකයන් සඳහා සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා ප්‍රථමාධාර හා ජීවිත ආරක්ෂක ක්‍රම පිළිබඳ පුහුණුව) මේ සම්බන්ධයෙන් මධ්‍යස්ථාන දෙකක් උතුරු ප්‍රදේශ වල ස්ථාපිත කළ යුතුව පවතී.

7.4.14 ශ්‍රී ලංකාවේ වෙරළ තීරය ආශ්‍රිත උවදුරු සඳහා සියළුම ස්ථරයන් ආවරණය වන බහුවිධ උවදුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිවල ධාරිතාවය ඉහළ නැංවීම

ADPC - UNESCAP මඟින් අරමුදල් සැපයෙන ව්‍යාපෘතියක් වන මෙය පළාත් පාලන ආයතන සහ අවදානමෙහි සිටින ප්‍රජාවන් සම්බන්ධ කර ගනිමින් සියලුම ස්ථර ආවරණය වන පරිදි බහුවිධ උවදුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය වන ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා විස්තීර්ණ හිඩැස් විශ්ලේෂණයක් පවත්වන ලදී. එයට අමතරව මෙම ව්‍යාපෘතිය මගින් වෙරළබඩ ප්‍රජාවගේ ප්‍රත්‍යාස්ථාව (CCR) පිළිබඳ රාමුව සමාලෝචනය කිරීමත්, CCR පිටුවේ අත්‍යවශ්‍ය කොටසක් වශයෙන් බහුවිධ උවදුර පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියක් ඒකාබද්ධ කිරීම පිළිබඳ හැකියාව සොයාබැලීමත් සිදු කරන ලදි. එහි විස්තර පහතින් දැක්වේ.

- මාස 03ක මූලික පරීක්ෂාවක් සහිතව ප්‍රාදේශීය මට්ටමින් VHF රේඩියෝ මධ්‍යස්ථාන 2ක් සම්පූර්ණයෙන්ම ස්ථාපිතකොට ඇත. පහත ස්ථානවල උපකරණ සවිකොට ඇති අතර දේශීය භාෂාවෙන් VHF පරිශීලක මාර්ගෝපදේශයක් සකස්කොට ඇත. නියමු ස්ථානවල පූර්ව අනතුරු ඇඟවීමේ තොරතුරු ව්‍යාප්ත කිරීම වැඩිදියුණු කිරීම සඳහා කුච්චවේලි පොලිස් ස්ථානයේත් කල්කුඩා / පාසිකුඩා ප්‍රදේශ සඳහා කල්කුඩා වරායෙත් කටයුතු කෙරේ.

වෙරළ තීරයේ සිදුවන උවදුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කිරිමට නියමු ප්‍රජාවන්හි සියලු සාමාජිකයන් සමඟ ක්ෂේත්‍ර මට්ටමේ ජන හමු පවත්වන ලදී. VDMC, යොවුන් ස්වේච්ඡා කණ්ඩායම් ධීවර සමූපකාර සහ අදාළ DDMCU සම්බන්ධ කරගනිමින් නියමු ප්‍රදේශයන් දෙක තුළ ප්‍රාදේශීය මට්ටමේ 'ප්‍රජා පූර්ව අනතුරු හැඟවීම් හා ප්‍රතිචාර ඒකක' දෙකක් ස්ථාපිත කරන ලදී. ආරක්ෂිත ස්ථාන කරා ඉවත් වීමේ සිතියම්, ආරක්ෂිත ස්ථාන හඳුනා ගැනීම, අනතුරු හැඟවීම් ව්‍යාප්ත කිරීම සඳහා ක්‍රියා පටිපාටි සහ ආරක්ෂිත ස්ථාන කරා ඉවත්වීම සඳහා වන කටයුතු ඒකාබද්ධව වැඩිදියුණු කරන ලදි.

- මෙම පද්ධතිය පරීක්ෂා කිරීම සඳහා ප්‍රජා මට්ටමේ ''පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති පෙරහුරු සහ ප්‍රතිචාර'' වැඩසටහන් 2014 දෙසැම්බර් මස 12 වන දින ජාතික සුනාමි පෙරහුරු වැඩසටහන හා සම්බන්ධ වෙමින් කල්කුඩාහි දී පවත්වන ලදී.
- ''සියලුම ස්ථර ආවරණය වන ප්‍රජා පූර්ව අනතුරු ඇඟවීම් ව්‍යාප්ත කිරීම සහ වෙරළබඩ උවදුරු සඳහා ප්‍රතිචාර සැලසුම් කිරීම හා ක්‍රියාපටිපාටි'' සඳහා ප්‍රාදේශීය මට්ටමේ අත් පොතක ආකෘතියක් සකසමින් පවතින අතර පිලිපීනයේ ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය සහ ADPC මගින් එහි කෙටුම්පත් කටයුතු සිදු කරමින් පවතී.
- ''මාධ්‍ය සහ දැනුවත් කිරීමේ මාර්ගෝපදේශ සහ උපකරණ'' පිළියෙල කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, මාධ්‍ය සහ වෘත්තිකයන් සමඟ සහයෝගිතාවයෙන් සිදු කරමින් පවතින අතර එය භාරදීමට නියමිතය.
- SOP මාධ්‍ය වැඩසටහනක් සංවිධානය කරන ලද අතර මාධ්‍යවෙදීන් අතර කුඩා නාමාවලි බෙදා දෙන ලදී.
- ආපදා සැලසුම පිළියෙල කිරීම සහ සෙන්තූර් හා නසිවන්තිව්හි පැවති පෙරහුරු අභ්‍යාස
- සුනාමි අවදානම් සහිත දිස්ත්‍රික්කවල නිලධාරීන් සඳහා සිතියම් සැකසීම සහ පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ පුහුණු වැඩසටහනක් සංවිධානය කිරීම.
- කාලගුණ විද්‍යාඥයින් සඳහා දින 5ක කාලගුණ අනාවැකි සිදුකිරීම පිළිබඳ පුහුණුව සම්පූර්ණ කොට ඇත.
- ත්‍රිකුණාමලය, සෙන්තූර් නගරයේ ප්‍රජාවන් සඳහා පෙරහුරු අභ්‍යාස පවත්වන ලදී.

7.4.15 වෙරළබඩ උවදුරු පිළිබඳ පූර්ව අනතුරු හැඟවීම් සහ ප්‍රතිචාර : මෙවලම් සහ ජාත්‍යන්තර වශයෙන් සවිමත් කිරීම (2012 – 2014) (RIMES)

"වෙරළබඩ උවදුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම සහ ප්‍රතිචාර මෙවලම් සහ ජාත්‍යන්තර වශයෙන් සවිමත් කිරීම" පිළිබඳ RIMEC ව්‍යාපෘතිය 2012 ජූලි 6 වන දින දියත් කරන ලද අතර එය 2014 ජුනි 30 දක්වා ක්‍රියාත්මක වනු ඇත. මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ ධාරිතා වර්ධන ක්‍රියාකාරකම්වලට සහාය දක්වනු ලබන අතර අවශ්‍ය අධි විභේදන දත්ත කට්ටලයක් නිර්මාණය කිරීම ඇතුලුව සුනාමි ජල ගැල්ම පිළිබඳ ආදර්ශ සහ අවදානම් ඇගයීම පිළිබඳ ධාරිතා වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන්ම කේන්ද්‍රය වීම සිදු වේ. හම්බන්තොට ප්‍රදේශයේ පවතින බොක්කක් ආකාරයේ ලක්ෂණය, සුනාමි පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා ගැළපෙන බැවින් නියමු ස්ථානයක් වශයෙන් හම්බන්තොට තෝරාගන්නා ලදී. එයට අමතරව, සුනාමි හානි පිළිබඳව තක්සේරු කිරීම සඳහා නගර ප්‍රදේශය තුළ සුනාමි අවදානම් තක්සේරුව පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කරන ලද අතර හම්බන්තොට නගර ආසන්න ප්‍රදේශය වෙත අඩු විභේදන විශ්ලේෂණය ව්‍යාප්ත කරන ලදි.

RIMES ව්‍යාපෘතිය යටතේ (2012 ජූලි 6 වැනි දින ආරම්භ වී 2014 ජුනි 30 දක්වා) LIDAR දත්ත මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන වෙරළ ආසන්න භූ ලක්ෂණ පිළිබඳ කේතිය දත්ත වශයෙන් භාවිතා කරන ලදී. සුනාමි අවදානම් සිතියම සහ ඉවත් කිරීමේ සැලැස්ම වැඩිදියුණු කිරීම, ප්‍රාදේශීය සුනාමි සේවා සපයන්නන් RTSPS වෙතින් සුනාමි අනතුරු ඇඟවීම් දත්ත ලබාගැනීම සම්බන්ධව පැවතිය හැකි සබැඳුම වශයෙන් සැලකිය යුතුය. මෙම ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කරන ලද අතර අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිතය.

7.5 2014 වර්ෂය තුළ දී හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (EOC) මගින් සිදු කරන ලද වෙනත් ක්‍රියාකාරකම්

7.5.1 EOC චාරිකා සහ පුහුණු

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (EOC) මගින් පාර්ශවකරුවන්, පාසල් සිසුන්, විදේශීය නියෝජිතයන් සහ රජයේ නිලධාරීන් සඳහා හදිසි මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීමේ EW ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.



හදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන EOC මගින් හදිසි මෙහෙයුම් සහ පූර්ව අනතුරු හැඟවීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි

8. මූල්‍ය ප්‍රගතිය (2014 දෙසැම්බර් 31)

2014 වර්ෂයේ දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා රු. මිලියන 945 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. ඉන් රු. මිලියන 160ක් පුනරාවර්තන වියදම් වශයෙන් ද, රු. මිලියන 14.03ක් ජාතික සභාවේ වියදම් වශයෙන් ද රු. මිලියන 770.97ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් ද වෙන් විය. මෙම සමස්ත මුදලින් රු. මිලියන 901.52ක ඒකාබද්ධ වෙන් කිරීමක් භාණ්ඩාගාරය මගින් නිදහස් කොට ඇති අතර ඉතිරි මුදල් ලැබීම් ද සමඟ 2014 දෙසැම්බර් 31 වන දින වන විට රු. මි. 926.34ක මුදලක් වියදම්කොට ඇත. 2014 දෙසැම්බර් 31 වන විට ආයතනයේ කාර්යසාධන වාර්තාව 8.1 වගුව තුළ දක්වා ඇත.

2014 දෙසැම්බර් 31 වන විට මූල්‍ය කාර්යසාධන වාර්තාව

වැය විෂය අංකය	වැඩසටහන / ක්‍රියාකාරකම	අයවැය ප්‍රතිපාදනය 2014 (රු.මී.)	ලැබුණු අග්‍රිම (රු.මී.)	වැයවූ අරමුදල් (රු. මී.)	ප්‍රතිපාදන වෙන් කිරීමට සාපේක්ෂව මූල්‍යමය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය
106-02-03-01-1503	ආපදා කළමනාකරණ ජාතික සභාව (NCDM)	14.03	12.5	11.85	95	95
106-2-3-2-1503	පුනරාවර්ථන වියදම් (DMC)	160	160	159.91	100	100
ප්‍රාග්ධන වියදම් - දේශීය						
106-2-3-3-2401	හැකියා වර්ධනය මානව සම්පත් සංවර්ධනය	0.5	0.5	0.5	100	100
106-2-3-5-2201 (I & II)	දිස්ත්‍රික්කවල ආපදා අවදානම අවම කිරීම සඳහා ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම(කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති)	500	485.3	485.3	97	97
106-2-3-5-2201 (III)	හදිසි අවස්ථාවකදි ආරක්ෂිතව ඉවත් වීම	50	50	50	100	100
106-2-3-7-2201	හදිසි ගංවතුර හා නියඟය ආශ්‍රිත අවස්ථාවන්ට මුහුණදීම සඳහාඋපකරණ මිලට ගැනීම	75	75	74.98	100	100
106-2-3-8-2201	පෙර සූදානම් සැලසුම් පිළියෙල කිරීම සඳහා රජයේ ආයතනවලට සහාය වීම	10	10	9.05	90	90
106-2-3-22-2201	පානදුර, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ගංවතුර අවම කිරීම	45	45	45	100	75*
106-2-3-23-2201	දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුර අවම කිරීම	20	20	20	100	90*
106-2-3-24-2201	යාපනය දිස්ත්‍රික්කයේ ගංවතුර අවම කිරීම	50	50	50	100	100

106-2-3-25-2201	දැනුවත්භාවය ගොඩනැගීම	12	12	11.58	96	96
	සමස්ත ප්‍රාග්ධන වියදම	**762.5**	**747.8**	**746.41**		
ප්‍රාග්ධන වියදම විදේශීය						
106-2-3-26-2201	පූර්ව අනතුරු හැඟවීමේ පද්ධතින්හි ධාරිතා වර්ධනය UNHABITAT	8.467	8.467	8.17	96	97
	මුළු ප්‍රාග්ධන වියදම (දේශීය හා විදේශීය අරමුදල්)	**770.97**	**756.27**	**754.58**		

වගුව 8.1: 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය

- පරිපාලන ගැටලු හේතුවෙන් කළුතර හා දඹුල්ල ව්‍යාපෘති ප්‍රමාදයක් සහිතව 2014 වර්ෂයේ ආරම්භ කරන ලද අතර එබැවින් ඒවා තවමත් අවසන්කොට නැත. කලින් වසරේ හිඟව පැවති ගෙවීම්වලට අදාළ බිල්පත් ගෙවීම් ද සමඟින් ගෙවීම් සඳහා වසරේ සමස්ත අයවැය ප්‍රතිපාදනයම භාවිතකොට ඇත. එම හේතුව නිසා වසරේ භෞතික ප්‍රගතිය අභිබවා මූල්‍ය ප්‍රගතිය ඉහළ යාමක් සිදුවී ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
2014 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය තත්ත්වය

	සටහන්	2014 රු. ශත	2013 රු. ශත.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	05	1,460,770,656.98	1,691,023,694.83
ජංගම වත්කම්			
නොනිමි ප්‍රාග්ධන කාර්යයන්	06	77,262,863.25	89,171,689.92
ආපදා ප්‍රතිචාර උපකරණ තොග	07	13,193,408.48	15,510,050.56
බඩු ලේඛන	08	2,887,945.41	2,377,930.16
පෙර ගෙවුම් සහ අත්තිකාරම්	09	9,269,335.23	3,927,602.90
තැන්පත් සහ අනෙකුත් ලැබිය යුතු දෑ	10	1,435,163.62	1,435,163.62
මුදල් සහ මුදල්තුල්‍යන්	11	5,755,454.02	15,692,118.02
මුළු ජංගම වත්කම්		**109,804,170.01**	**128,114,555.18**
මුළු වත්කම්		**1,570,574,826.99**	**1,819,138,250.01**
අරමුදල් සංචිත සහ වගකීම්			
දළ වත්කම්/ කොටස්		-	-
සමුච්චිත අරමුදල		**(35,294,840.79)**	**(41,740,875.81)**
සංචිත			
භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන		901,357,691.45	540,245,702.20
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන - භාණ්ඩාගාරය		12,245,000.00	16,985,000.00
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන - ICET		1,423,794,229.73	1,646,126,656.73
ප්‍රාග්ධන ප්‍රදානමත ආයෝජන	12	(752,671,921.64)	(366,801,288.19)
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට ගනිමින් පැවති පිරිවැය රු.24,149,095 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් නොවූ ව්‍යාපෘති 52 ක පිරිවැය රු.343,460,435 වූ අතර එම අගය වැඩ අවසන් වූ ව්‍යාපෘති වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂය තුළදී මධ්‍යස්ථානය වෙත යතුරුපැදි 12 ක් එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙතින් ලැබී තිබුණු නමුත් එම වත්කම් මධ්‍යස්ථානයේ නමට පවරා අගය කර ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මධ්‍යස්ථානය විසින් මිළදී ගෙන තිබුණු රු.93,455 ක් වටිනා කාර්යාලීය උපකරණ වත්කම් වශයෙන් ගිණුම්ගත කරනු වෙනුවට කාර්යාලීය උපකරණ අළුත්වැඩියා වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේදී ආපදා කළමනාකරණ ජාතික සභාවේ අරමුදල මගින් ජාතික ආරක්ෂිත දිනය පැවැත්වීම වෙනුවෙන් රු.5,140,984 ක් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ලබාදී තිබුණු අතර ඊට අදාළ වියදම් කහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

	නීති,රීති, හා රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම්
(අ)	2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛය	ද්විතීයන පදනම මත අනුයුක්තව සිටින නිලධාරීන් වෙත වාහන සහ ඉන්ධන දීමනාව ලබාදීමට ප්‍රථම අදාළ නිලධාරියා ස්ථිර සේවා ස්ථානයෙන් එම පහසුකම් ලබා නොගන්නා බවට ලිඛිත තහවුරුවක් ලබාගත යුතු වුවත් එසේ බදවාගත් නිලධාරියෙකුට ලිඛිත තහවුරුවකින් තොරව මාස 05 ක කාලයක් සඳහා එම පහසුකම් ලබාදී තිබුණි.
(ආ)	1993 දෙසැම්බර් 31 දිනැති අංක පීපීඒ/ 6/1/1 සහ 2010 ජූලි 09 දිනැති අංක සීඒ/1/1/16/1 ජනාධිපති කාර්යාල චක්‍රලේඛය	රජයේ නිලධාරීන් නිල විදේශ සංචාරයක යෙදී ආපසු දිවයිනට පැමිණීමෙන් පසු දින 07 ක් ඇතුළත චක්‍රලේඛයේ "ඊ ඇමුණුමෙහි දක්වා ඇති ආකෘතිය අනුව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී විදේශ වැඩමුළු සහ සම්මන්ත්‍රණ 14 කට සහභාගීවූ නිලධාරීන් 07 දෙනෙකු අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 104 හා මුදල් රෙගුලාසි 110	සමාලෝචිත වර්ෂය තුළදී මධ්‍යස්ථානය සතු වාහන 09 ක් අනතුරු 10 කට භාජනයවී තිබුණු අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක් හෝ පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, ඒ පිළිබඳ විස්තර භාණ්ඩ ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 371 (2)(ආ) සහ (5) වගන්ති	(i) අත්තිකාරම් ලෙස ලබාදුන් මුදල් කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත් අවස්ථා 23 කදී එකතුව රු.254,900 ක අත්තිකාරම් මුදල් මාස 02 සිට මාස 10 දක්වා කාල පරාසයක් තුළ ප්‍රමාද කර පියවා තිබුණි. තවද, අත්තිකාරම් ලෙස ලබාදුන් සියළුම මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට එසේ නිරවුල් නොකළ අත්තිකාරම් මුදල්වල එකතුව රු.1,885,238 ක් විය.
	(ii) ලබාගැනීමට අපේක්ෂිත සැපයුම් හෝ සේවාව සඳහා සෘජුවම ගෙවීම් කළහැකි වුවද, දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්ත කර තිබුණු වාහන අළුත්වැඩියා කිරීම සඳහා අත්තිකාරම් වශයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත මුදල් ප්‍රතිපාදනය කර තිබුණි. එසේ ප්‍රතිපාදනය කර තිබුණු මුදලින් රු.557,154 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.2,616,060 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,452,720 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,068,780 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මධ්‍යස්ථානයේ මෙහෙයුම් වියදම් රු.18,003,277 කින් වැඩිවී තිබුණද ආදායම රු.30,072,057 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) දිවයිනේ විවිධ ප්‍රදේශවල ගංවතුර, නායයෑම්, නියං, සුළිසුළං, වෙරළ බාදනය සහ සත්ත්ව ප්‍රහාර වැනි ව්‍යසන පිළිබඳව හඳුනාගෙන ඒවා අවම කිරීමට කටයුතු කිරීම සඳහා මධ්‍යස්ථානය විසින් ආපදා අවදානම් අවමකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ සහ මහා පරිමාණ වශයෙන් ව්‍යාපෘති, සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල රු.537,032,019 ක් විය. මධ්‍යස්ථානය විසින් ආපදා අවම කිරීම සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු.538,817,431 ක් ප්‍රතිපාදන නිදහස් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්ම අනුව මධ්‍යස්ථානය මගින් ව්‍යාපෘති 148 ක් ක්‍රියාත්මක කළයුතු බව දක්වා තිබුණු නමුත් මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති 108 ක් පමණක් දක්වා තිබීම හේතුවෙන් මෙම ආයතනවල ක්‍රියාකාරී සැළැසුම් සමගාමී නොවූ බව නිරීක්ෂණය විය.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ යටතේ සඳහන් කර තිබුණු සියලු ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු වුවද, 2013 දෙසැම්බර් 31 දිනට කටයුතු අවසන් නොකර තිබුණු නමුත් 2014 වර්ෂය තුළදී රු.4,160,000 ක් වැය කර වැඩ අවසන්කරන ලද හම්බන්තොට

දිස්ත්‍රික්කයේ පිහිටි පුංචි අප්පු ජදුර වැවේ රළපනාව සකස් කිරීමේ ව්‍යාපෘතිය, 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට ඇතුලත් කර නොතිබුණි.

(iii) ව්‍යාපෘතියකට මුදල් ප්‍රතිපාදනය ලබාදීමට ප්‍රථම විධිමත් පරිදි ව්‍යාපෘති යෝජනාවලියක් සකස්කර ඉදිරිපත් කළ යුතු වුවත් ආපදා අවමකිරීමේ ව්‍යාපෘති 108 කට අදාළව ව්‍යාපෘති යෝජනාවලින් ඉදිරිපත් නොකර ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. එම ව්‍යාපෘතිවල ඇස්තමේන්තු වටිනාකම රු.324,553,620 ක් විය.

(iv) මධ්‍යස්ථානය විසින් 2013 නොවැම්බර් 25 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයක් මගින් ව්‍යාපෘති සඳහා අත්තිකාරම් වශයෙන් ලබාදෙන මුදල මුළු ඇස්තමේන්තු වටිනාකමින් සියයට 40 පමණක් බව දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරු වෙත දන්වා තිබුණි. කෙසේවුවද, මෙම සීමාව නොසලකා ව්‍යාපෘති 09 ක් සඳහා මුළු ඇස්තමේන්තුගත මුදලින් සියයට 42 ක් සිට සියයට 77 ක අතර පරාසයක අත්තිකාරම් ලබාදී තිබුණි.

(v) ආපදා අවමකිරීමේ ව්‍යාපෘති ආරම්භයේදී කොන්ත්‍රාක්කරුවන් සමග ගිවිසුමකට එළඹිය යුතු වුවත්, ඇස්තමේන්තු වටිනාකම රු.230,209,426 ක් වූ ආපදා අවමකිරීමේ ව්‍යාපෘති 71 ක් සඳහා ගිවිසුම් පත්‍ර ඉදිරිපත් කර නොතිබුණි.

(vi) ආපදා අවමකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් පසුව එම මුදල් වියදම් දැරීම සඳහා වූ රික්විසිසන් පත්‍ර, දිස්ත්‍රික් ලේකම් මුදල් ලබාගත් බවට රිසිට් පත් සහ ව්‍යාපෘති අවසන් කළ බවට වාර්තාවක් මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තු වටිනාකම රු.501,132,349 වූ ව්‍යාපෘති 167 ක් සඳහා අදාළ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(vii) ආපදා අවමකිරීමේ ව්‍යාපෘති සඳහා මුදල් ලබාදීමෙන් පසුව එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පරීක්ෂා කළයුතු අතර එසේම අත්තිකාරම් ලබාදුන් පසු ඉතිරි වාරික ගෙවීමේදීද, මෙම පසුවිපරම් කිරීම සිදුකළයුතු වුවත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණු දිස්ත්‍රික්ක 22 ක එසේ පසුවිපරම් සිදුකළ බවට වාර්තා ඇතුළත්වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති 143 ක් ක්‍රියාත්මක කර තිබුණද විගණන දිනය වූ 2015 මාර්තු 31 දින වන විටත්, ඉන් වැය නොකළ මුදල් මධ්‍යස්ථානය වෙත ආපසු එවීමට කටයුතු කර තිබුණේ, ව්‍යාපෘති 37 ක් මඟින් පමණි.

ව්‍යාපෘති 106 ක් සඳහා වියදම් වාර්තා ලබා නොගැනීම නිසා 2015 මාර්තු 31 දින වන විටත් ඉතිරි මුදල් මධ්‍යස්ථානය වෙත එවා නොතිබුණි. ඒ අනුව ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සඳහා වෙන්කරන ලද මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල රඳවා නොගෙන මධ්‍යස්ථානය වෙත ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මධ්‍යස්ථානය විසින් ලබාදුන් තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය තුළදී සුළු හා මධ්‍ය පරිමාණ ආපදා අවමකිරීමේ ව්‍යාපෘති යටතේ වර්ෂය අවසානයට වැඩ අවසන් නොවූ ව්‍යාපෘති 09 ක් වශයෙන් දක්වා තිබුණද දිස්ත්‍රික් කාර්යාල 13 කින් ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවලට අනුව එම ව්‍යාපෘති 09 ට අමතරව රු.95,983,256 ක අත්තිකාරම් නිදහස් කර තිබුණු ව්‍යාපෘති 27 ක වැඩ අවසන්වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ii) තවද සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 03 ක ව්‍යාපෘති 20 ක් සඳහා රු.46,534,568 ක් වූ සම්පූර්ණ ඇස්තමේන්තුගත මුදලම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදී තිබුණු නමුත් දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අවසන් කිරීමට අපේක්ෂිත මහා පරිමාණ ව්‍යාපෘති 03 ක කටයුතු 2011 වර්ෂයේ දී ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා අනුව කළුතර හා පානදුර ප්‍රදේශවල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියේ සහ දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 2015 මාර්තු මාසය වනවිටත් අවසන්කර නොතිබුණි. තවද, යාපනය අර්ධද්වීපයේ ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා විගණනය වෙත ලබාදී නොතිබුණි.

(ඈ) ආපදා අවදානම් අවම කර ගැනීමේ අරමුණින්, සෑම දිස්ත්‍රික්කයම පෙර සුදානම් සැලසුම් කිරීම මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේදී පෙර සුදානම් සැලසුම් කිරීම වෙනුවෙන් වැඩසටහන් 797 ක් සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.8,003,000 ක මුදලක් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රේෂණය කර තිබුණි. එම වැඩසටහන් සම්බන්ධයෙන් ආරම්භක අවස්ථාවේදී ක්‍රියාකාරී සැලසුම් හා වැඩසටහන අවසානයේදී කලවැඩ වාර්තාවක් සකස්කර ඉදිරිපත් කර තිබුණද, සහභාගිවූවන්ගේ ප්‍රතිචාර හා ගැටළු ඵවම කර ගැනීමට ඉදිරිපත් කරන ලද නිර්දේශයන් එම වාර්තාවලට ඇතුළත්වී නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් 2009 වර්ෂයේදී පාදුක්ක ප්‍රදේශයේ තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානයක් ස්ථානගත කර එහි රු.72,471,168 ක් වටිනා උපකරණ සවිකර තිබුණි. කෙසේවුවද, මෙම මධ්‍යස්ථානය 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක නොවූ අතර 2015 මැයි 15 දින වන විට එම උපකරණ ගලවා ඉවත් කර මධ්‍යස්ථානයේ ගබඩාවේ තැන්පත් කර තිබුණි.

(ආ) නෙදර්ලන්ත විදේශ ණය ආධාර යටතේ ලබාගෙන දිස්ත්‍රික්ක 14 ක් තුළ ස්ථාපනය කරන ලද සුනාමි සහ පෙර දැනුම්දීමේ සංඥා කුළුණු 77 ක් සඳහා වන්ද්‍රිකා තාක්ෂණය සම්බන්ධ කිරීම වෙනුවෙන් ඇමරිකන් සිග්නල් කෝපරේෂන් ආයතනයට වාර්ෂිකව රු. 6,778,353 ක ගාස්තුවක් ගෙවා තිබුණු නමුත් එම ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ නගර සම්බන්ධයෙන් ආපදා ප්‍රත්‍යාස්ථ නගර සංවර්ධනය කිරීම හා උපාය මාර්ගික පෙර දැනුම්දීමේ ධාරිතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ විවිධ කාර්යයන් වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් රු.10,260,000 ක් මධ්‍යස්ථානය වෙත සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණු අතර ඉන් රු.7,410,000 ක් අදාල අවශ්‍යතාවය සඳහා යොදවා නොගෙන භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි.

(ඈ) මධ්‍යස්ථානය විසින් හදිසි ප්‍රතිචාර සඳහා සමාලෝචිත වර්ෂය තුළ මිළදීගත් උපකරණ වලින් රු.13,193,408 ක් වටිනා උපකරණ වර්ග 13 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් බෙදාහැරීම් සිදු නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඉ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක 2010 වර්ෂයේදී ඉදිකර තිබුණු නමුත් එම ඉඩම මධ්‍යස්ථානය වෙත පවරා ගැනීමේ කටයුතු 2015 ජුනි 30 දින දක්වා අවසන්වී නොතිබුණි.

(ඊ) සංවිධානයට අයත් රු.206,011 ක් වටිනා භාණ්ඩ තොගයක් අස්ථානගතවී වර්ෂ 07 ක පමණ කාලයක් ගතවී ඇතත් එම වටිනාකම අයකරගැනීමට හෝ කපාහැරීමට අවශ්‍ය කටයුතු නොතිබුණි.

(උ) විනය පරීක්ෂණයකින් වැරදිකරුවන්වූ මධ්‍යස්ථානයේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2011 වර්ෂයේ සිට රු.272,168 ක්ද, තවත් නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2014 දී රු.132,000 ක්ද, අයවිය යුතුව තිබුණු නමුත් 2015 ජූනි 30 දින දක්වාම එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) මධ්‍යස්ථානය සතු වාහනයක් සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේදී අනතුරට පත්ව තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් රු.168,645 ක අලාභයක් ගණනය කර තිබුණි. එම අලාභය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ ජූලි මාසයේදී එම අනතුරට වැරදිකරු වූ නිලධාරියා වෙත දන්වා තිබුණු නමුත් 2015 ජූනි 30 දින දක්වාම අයකර ගැනීමට මධ්‍යස්ථානය අපොහොසත්වී තිබුණි.

4.3 කාර්යය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු සංඛ්‍යාව 257 ක් වූවද තථ්‍ය තනතුරු සංඛ්‍යාව 224 ක් වීමෙන් පුරප්පාඩු 33 ක් විය. ඒ අනුව අධ්‍යක්ෂකවරයෙක්, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් 07 ක්, භාෂා පරිවර්තක 02 ක් සහ සන්නිවේදන තාක්ෂණික ශිල්පීන් 03 ක් සම්බන්ධයෙන් වර්ෂ 04 කට වඩා පැවති පුරප්පාඩු පිරවීමට 2015 ජූනි 30 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානයේ ආපදා වැළැක්වීම සහ අවම කිරීම සඳහා වූ අංශය අධ්‍යක්ෂ (මෙහෙයුම්) සහ සහකාර කළමනාකරණ නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත වුවද, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා සහ ව්‍යාපෘතිවල පසුවිපරම් කටයුතු පරීක්ෂාවට අවශ්‍ය තාක්ෂණික නිලධාරීන් පත්කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුහාවය සහ යහපාලනය

5.1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පනත ස්ථාපිත කිරීම

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 18 වගන්තිය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාත්මකව තිබුණි. මෙම පනත ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සංශෝධනය කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත 2014 ජූනි 16 දින ඉදිරිපත් කර තිබුණි. 2015 අගෝස්තු 31 දින වනතෙක් සංශෝධිත කෙටුම්පත් පනත සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

5.2 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම

මෙම සැලැස්ම 2015 මැයි 31 දින තෙක්ම කෙටුම්පත් තත්ත්වයේ පැවතිණි.

5.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් පැවතියද ඊට විගණන නිලධාරීන් 02 ක් පමණක් අනුයුක්ත කර තිබුණු බැවින් මධ්‍යස්ථානයේ සියළුම කටයුතු ආවරණය කළහැකි වන පරිදි පූර්ණ විගණනයක් සිදුකළ නොහැකිවී තිබුණි.

6. පද්ධති හා පාලනයන්

මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය හා සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති

(ඇ) කාර්ය මණ්ඩලය පාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
306/72,
බත්තරමුල්ල.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක ඩීඊ2/ජී/ඩීඑමසී/1/14/18 හා 2015 ජූලි මස 08 වන දිනැති ලිපිය හා බැඳේ. ඊට අදාල කරුණු දැක්වීම පහත පරිදි වේ.

2.1 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
2.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07

එකඟවෙමි.
2015 වර්ෂයේ සිට අදාල ප්‍රමිතයට අනුව කටයුතු කෙරේ.

2.1.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) එකඟවෙමි.
2015 වර්ෂයේ ස්ථාවර වත්කම් ගිණුමට ඇතුලත් කර ඇත.

(ආ) එකඟවෙමි.
මෙම ව්‍යාපෘති 52 වැඩ අවසන් නොවූ ව්‍යාපෘති ලෙස ගිණුම් ප්‍රකාශනයේ ඇතුලත් කිරීමට අවශ්‍ය තොරතුරු මූල්‍ය අංශය වෙත ලබා දී නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කර නොමැත. 2015 වර්ෂයේ සිට අදාල තොරතුරු අදාල අංශයෙන් ලබාගෙන ගිණුම් ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.1.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
අදාල විස්තර 2015.07.13 දින විගණනය වෙත ඉදිරිපත් කර ඇත.

2.4 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) මෙම නිලධාරී මහතාහට රාජකාරී කටයුතු සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැමිණීමට සහ රාජකාරී අවසන් වී එම නිලධාරී මහතා පදිංචි නිවසට යාම සඳහා එක් වාහනයක් ආපදා

කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සපයන ලදි. මෙම නිලධාරියා මේ වන විට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මාස 05 ක පමණ කාලයක් සේවය කර ඇත. ඔහු වෙත ලැබී ඇති උසස්වීමත් සමග නැවත ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයට යෑම සඳහා අවශ්‍ය වන බවත් අධ්‍යක්ෂ (මෙහෙයුම්) තනතුර සඳහා වෙනත් නාවික හමුදා නිලධාරියෙකු නම් කර ඇති බැවින් එම අනුප්‍රාප්තික නිලධාරී වෙත එම තනතුරේ රාජකාරී භාරදීමට අනුමැතිය ලබා දෙන ලෙසත් දන්වා 2014.10.16 දිනැති ලිපිය මගින් මධ්‍යස්ථානය වෙත ඉල්ලීම් කර ඇත.

ජාතික අය වැය චක්‍රලේඛ අංක 1/2014 2.1.3 හි V වන ඡේදයේ දැක්වෙන පරිදි වාහන අනුයුක්ත කිරීම සම්බන්ධ විස්තර ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පැවතියද එම නිලධාරියා විසින් නැවත ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයට යෑමට අවශ්‍ය බව දන්වා තිබූ බැවින් එකී විස්තර ලබා ගැනීම සඳහා වන ලිපිය යොමු නොකරන ලදි.

(ආ) විදේශ පුහුණු රැස්වීම් වලට සහභාගි වීමට ප්‍රථම ඒ සම්බන්ධයෙන් වාර්තාවක් දින හතක් ඇතුලත ඉදිරිපත්කල යුතු බවට වාචිකව හා ලිඛිතව දන්වා ඇත.(අමාත්‍යාංශ අභ්‍යන්තර චක්‍රලේඛ 04/2014 මගින් සියළුම මාණ්ඩලික නිලධාරීන් වෙත යවා ඇත.)

ඒ අනුව එම නිලධාරින් විසින් සහභාගි වූ විදේශ නිල සංචාරවලට අදාල වාර්තා වාර්තා ඉදිරිපත් කර ඇත.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

(i) මුදල් රෙගුලාසි 104

මෙම අනතුරු 10ට අදාල ප්‍රාරම්භක වාර්තාව හෝ පරිපූර්ණ වාර්තාව මසක කාලයක් තුල ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ii) මුදල් රෙගුලාසි 110

හානි ලේඛණය ඇතුලත් කිරීමට අවශ්‍ය තොරතුරු මුල්‍ය අංශයට ලබා දී නොනිබීම හේතුවෙන් එහි ඇතුලත් කිරීමට නොහැකි වූ අතර ඉදිරියේදී පාලන අංශයෙන් අදාල තොරතුරු ලබාගෙන හානි ලේඛණයේ ඇතුලත් කිරීමට කටයුතු කෙරේ.

(iii) මුදල් රෙගුලාසි 371 (2) (ආ)

මුදල් අත්තිකාරම් ලබා ගැනීම හා පියවීම සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි කර අභ්‍යන්තර චක්‍ර ලේඛයක් 2015 මැයි මස 29 වන දින සියළු නිළධාරීන් වෙත නිකුත් කර ඇති අතර ජුනි මස සිට අදාල චක්‍ර ලේඛය අනුව සියළුම නිළධාරීන් කටයුතු කළයුතු බවට උපදෙස්ද එ මගින් ලබා දී ඇත. ඒ අනුව මින් ඉදිරියට අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයන් ඇති වීමට ඉඩක් නොමැතිබව කාරුණිකව දන්වා සිටිමි.

(iv) මුදල් රෙගුලාසි 371 (5)

i මෙම අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කර ඇත. මෙම වසරේ සිට ඉදිරියට සියලු (මුදල් හා වැඩ) අත්තිකාරම් දෙසැම්බර් 31 දිනට පෙර නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(v) මුදල් රෙගුලාසි 757 (1) (අ) සහ (ආ)

ඉදිරියේදී මුදල් රෙගුලාසි 757 (1) (අ) සහ (ආ) අනුව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(vi) මුදල් රෙගුලාසි 1647

ආයතනය සතු වාහන 37 න් 25ක් සම්බන්ධයෙන් ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් පවත්වා ඇති අතර ඊට අදාල වාර්තා සකසමින් පවතී. ඉතිරි වාහන 12ද කඩිනමින් සමීක්ෂණ කටයුතු අවසන් කර අදාල සම්පූර්ණ වාර්තාව මසක් තුල ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති

(අ) 2014 වසරේ ක්‍රියාකාරී සැලැස්ම 2013 වසරේ අගභාගයේදී ප්‍රමුඛතා ව්‍යාපෘති සකසා ඒ අනුව සකස් කර ඇත. එබැවින් මුල් අවස්ථාවේදී ව්‍යාපෘති 148 ක් ඇතුලත් කර තිබුණද පසුව ව්‍යාපෘති පිළිබඳව ප්‍රාදේශීය දේශපාලන අධිකාරියෙන් හා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවෙන් ලද තොරතුරු මත ප්‍රමුඛතා ව්‍යාපෘති සකසා ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට සිදුවීම නිසා වෙන්කරන ලද ප්‍රතිපාදන තුළ ව්‍යාපෘති 108 ක් පමණ ක්‍රියාත්මක කිරීමට සිදුවිය. සංශෝධිත ව්‍යාපෘති ලැයිස්තුවේ පිටපතක් අමාත්‍යාංශය වෙත හා අන්තර් කාලීන කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර සංශොධිත ක්‍රියාකාරී සැලැස්මේ පිටපතක් විගණනය වෙතද ඉදිරිපත් කර ඇත.

(ආ) මධ්‍යස්ථානයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි මෙම ව්‍යාපෘති ඉදිරිපත් කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) මෙම ව්‍යාපෘතිය 2014 වසරේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීම අතපසු වීමක් වන අතර ප්‍රගති සමාලෝචනයේදී එම ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉදිරිපත් කර ඇත. මින් ඉදිරියේදී එවැනි අඩුපාඩුවක් සිදු නොවීමට කටයුතු කෙරේ.

(ඈ) ඉදිරි වර්ෂය සඳහා ව්‍යාපෘති වල මුදල් වෙන්කර ගැනීමේදී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘතිවල සංෂිප්ත වාර්තාවක් එහි ආකෘතිය අනුව ඉදිරිපත් කරන අතර ඇස්තමේන්තුගත අගය වන්නේ දළ අගයකි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මිනුම් සිදුකොට නැවත සවිස්තරාත්මක ඇස්තමේන්තු ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඉ) මෙහිදී 40% වඩා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබාදීමට හේතු වූයේ ප්‍රතිපාදන ප්‍රමාද වීම නිසා ව්‍යාපෘති සඳහා ගිවිසුම් ගත වීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට ගැටළු සහගත තත්ත්වයක් පැන නගින බව පැවසීම නිසා ගිවිසුම් ගත වීම පමාවීම වැලැක්වීමටත් සහ එම දිස්ත්‍රික්කවල පෙර වර්ෂයේ පැවති ප්‍රගතිය මත කාර්යක්ෂමව ව්‍යාපෘති නිම කිරීමට අවශ්‍ය සහය ලබාදීමටත්ය. එමෙන්ම ඇතැම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ව්‍යාපෘති සඳහා ගිවිසුම් ගත වීමේදී මධ්‍යස්ථානය විසින් ලබාදෙන මුදලින් 20% පමණ ප්‍රතිපාදන ප්‍රමාණයක් කොන්ත්‍රාත්කරුවන් වෙත නිකුත් කිරීමට කටයුතු යොදා තිබීමද මීට හේතුපාදක විය. කෙසේවුවද එම අඩුපාඩුව නිවරදි කර ගැනීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.

(ඊ) ව්‍යාපෘතිවලට අදාළ සියලුම ගෙවීම් පත්‍රිකා හා ගිවිසුම් මේ වන විට ගෙන්වා ගැනීමට පියවර ගෙන ඇති අතර ඉදිකිරීමේදී ගිවිසුම් ලබා දෙන තුරු ඉතිරි ප්‍රතිපාදන ලබා නොදීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(උ)මෙම රික්විසිෂන් පත්‍ර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකොට ඇති අතර රිසිට් පත්ද, ව්‍යාපෘතිය අවසන් කල බවට වාර්තා ද ලබා දෙන ලෙස දැනුවත් කර ඇත. ඒ අනුව එම රිසිට් පත් ව්‍යාපෘතිය අවසන් කල බවට වාර්තා ලබා ගැනීමට කටයුතු කර ඇත.

(ඌ) ව්‍යාපෘතිවල පසුවිපරම් පිළිබඳව වාර්තා අදාළ ව්‍යාපෘති ගොණුවේ ගොණුකර නොමැති වුවද ක්ෂේත්‍ර නිරීක්ෂණයට පසු අදාළ වාර්තා ඉදිරිපත් කර ඇත. ව්‍යාපෘතිවල ප්‍රගතිය මාසිකව අන්තර්කාලීන කළමනාකරණ සභාවට හා අමාත්‍යාංශයටද කාර්තුමය ලෙස නැවත අමාත්‍යාංශය වෙතද යොමුකොට ඇත.

(එ) මෙම ව්‍යාපෘතිය සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණයක්ද සිදු කොට ඇත. උක්ත ලිපිය දිස්ත්‍රික් ලේකම්තුමාගෙන් ලැබුණු පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන හොරණ ප්‍රාදේශිය ලේකම්තුමා ,පහත්බිම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය හා එම ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය හා පැවති සාකච්ජාවකින් පසු ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කරන බවට එකඟවීම මත ඉතිරි මුදල් ලබාදී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඒ) මෙම ව්‍යාපෘති සඳහා ක්ෂේස්ත්‍ර චාරිකා කිහිපයක් සිදුකොට ප්‍රාදේශිය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් සමඟද සාකච්ජා පවත්වා ඇත.එහෙත් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට අදාල පාර්ශවකාර ආයතනවල සහය ලබා ගැනීම සම්බන්ධව ගැටළු පැන නැගිණි. එබැවින් ව්‍යාපෘති ආරම්භය ප්‍රමාද වූ අතර දිර්ඝ සාකච්ජාවට කිහිපයකින් පසු ක්‍රියාත්මක කිරීම එකඟවුවද වසර අවසානයේ පැවති අධික වැසි සහිත තත්ත්වය නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ගැටළුකාරී තත්ත්වයක පැනනැගුණි.

(ඔ) ඉතිරි ව්‍යාපෘති 108 හි ඉතිරි මුදල් 2015.05.31 වන විට ගෙන්වා ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඕ) ව්‍යාපෘතිවල ප්‍රගතිය මාසිකව අන්තර් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර කාර්තුමය වශයෙන් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචනයේදීද ප්‍රගතිය සමාලෝචනය ලක්කොට ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කලයුතු උපදෙස් සහිත උපදේශන මාලාවක් සෑම දිස්ත්‍රික්කයක් වෙතම නිකුත් කොට ඇත. මීට අමතරව ක්ෂේස්ත්‍ර නිරීක්ෂණයන්ද සිදුකොට ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසා බලා අඩුලුහුඩුකම් පරීක්ෂාකොට ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසා බලා අඩුලුහුඩුකම් නිවැරදි කරගැනීමට කටයුතු කොට ඇත.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සම්බන්ධ ප්‍රධානතම ගැටළුව වූයේ ව්‍යාපෘතිවල ගෙවීම් සිදුකිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ලබාදෙන ලද මුදල් මධ්‍යස්ථානය හා සම්බන්ධ නොවන වෙනත් ගිණුම් සඳහා යොදවා ඇති බව වාර්තා වීමයි. එහෙත් එම ව්‍යාපෘති භෞතිකව අවසන්වී තිබීම නිසා ඒවා වැඩ අවසන් ව්‍යාපෘති ලෙස දක්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඉ)දිස්ත්‍රික්ක 03 ව්‍යාපෘති 18 ක් සඳහා රු. 45,870,783 ක මුදලක් වියදම්කර නොමැති බව ඩී්02/ජී/ඩීඑම්/සි/විවි12/2014 විගණන විමසුමට පිළිතුරු ලබාදීම මඟින්ද දන්වා ඇති අතර විගණන

වාර්තාවට අනුව එම ව්‍යාපෘති 20 ක් සඳහා රු. 46,534,568 ක් සම්පූර්ණ ඇස්තමේන්තු ගත මුදලම දිස්ත්‍රික් ලේකම් වරුන්ගට ලබා දී ඇති බවද සටහන් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

මේවන විට මෙම ව්‍යාපෘති 18න් 16ක් අවසන් කර ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ තිත්තකඩේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතිය හා ගම්පහ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 01ක් වසරේ අවසන් භාගයේ ආරම්භ කිරීමට සිදුවුයේ ප්‍රාදේශීය දේශපාලනයට සම්බන්ධ ගැටළුකාරී තත්ත්වයක් මතුවීම නිසා බව කාරුණිකව දැනුම් දෙන අතර ව්‍යාපෘති දෙසැම්බර් 31 වන විට ආරම්භ කොට තිබූ බවද කාරුණිකව දන්වා සිටිමි.

(ඊ)

(i) ව්‍යාපෘතියේ රු. 5,029,042 ක අවසන් බිල්පත්‍රයට අමතරව ව්‍යාපෘතියේ පරිපාලන වියදම් ලෙස රු.438,647 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රඳවා ගෙන ඇති බවත් ව්‍යාපෘතියට අදාල වැඩ අවසන් කිරීමේ වාර්තා ලබාදෙන ලෙසට සිහිකැඳවීම් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයට දන්වා ඇති බවත් එම වාර්තාව ලැබුණු පසු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි.

(ii) ගුරුගොඩ ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඇති වූ ගැටළුකාරී තත්වය මත පාලන අධිකාරියේ උපදෙස් මත රාජ්‍ය දෙපාර්තමේන්තුවක් වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමග ගිවිසුම් ගතව ව්‍යාපෘතිය අවසන්කල අතර ව්‍යාපෘතියේ අවසන් වාර්තාව සහ අදාල ගෙවීම්වල බිල්පත් ගෙන්වා ගැනීමට කඩිනමින් පියවර ගන්නා අතර ඉතිරි මුදල් මධ්‍යස්ථානය වෙත ප්‍රේෂණය කරන ලද රික්විසිෂන් පත්‍රය මේ සමඟ ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(iii) මෙම ව්‍යාපෘතියට අදාල වැඩ අවසන් වාර්තා, ගිවිසුම්පත්, රික්විසිෂන් පත් හා බිල් පත් සියල්ල මධ්‍යස්ථානය වෙත ලැබී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(iv) ජාතික ව්‍යසන කළමණාකරණ සභාවේ තීරණයන්ට අනුව මෙම ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා අත්තිකාරම් මුදල් ලබා දී ක්‍රියාත්මක කල අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ පරිපාලනයම ගැටළු කිහිපයක් මතු වූ බැවින් මාස කිහිපයක ප්‍රමාදයක් සිදුවූ බවත් , 2014 වර්ෂයේ දෙසැම්බර් මස 26 දින හම්බන්තොට පැවැත් වූ ජාතික සුරක්ෂිතතා දිනය ට සමගාමාව මෙම ව්‍යාපෘතිය විවෘත කිරීමට තීරණයකොට 2014 වර්ෂයේ දෙසැම්බර් මස 26 දිනය ප්‍රථම ව්‍යාපෘතියේ වැඩ අවසන් කරන ලද බවත් කාරුණිකව දන්වා සිටින අතර වසර දෙකක පමණ ප්‍රමාදයක් සිදු නොවූ බවද කාරුණිකව දන්වා සිටිමි.

(ක) (i) කළුතර ,පානදුර ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී මතු වූ ගැටළු කාරි තත්වය නිසා 2015.05.31 දිනට වැඩ නිම වී නොමැති අතර ඉතිරි වැඩ නිම කිරීම සඳහා කාලය දීර්ඝ කර ගැනීමක් ඉඩම් ගොඩ කිරීමේ දෙපාර්ත මේන්තුව විසින් සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

- මෙම බිල්පත් ලබා ගැනීමට කටයුතු කොට ඇත.

- ඉතිරි රු.36,726,383 ක මුදල 2015 මැයි මාසයේදී ගෙවා ඇති අතර ඊට අදාල රික්විෂන් පත්‍ර ගෙනවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

- මේ සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවල නිරීක්ෂණ කෙරේ අවධානය යොමුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ii)දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2011 වර්ෂයේ සිට 2012 වර්ෂයේ ඔක්තෝබර් මස 01 දින දක්වා ගෙවීම රු. 10,236,468.78 ලබා දී රික්විසිෂන් පත්‍රද ලබාගෙන ඇත. අනතුරුව දෙවන අදියරේදී පරිපාලනමය ගැටළු සම්බන්ධයෙන් ජනාධිපති විමර්ෂණයක් සිදුකල නිසා එම අදියර සඳහා වෙන්කරන ලද මුදල් ගෙවීමක් සිදුනොකට එම මුදල් දිස්ත්‍රික් මට්ටමේ අවම කිරීමේ ව්‍යාපෘති සඳහා යොදවා ඇත. 2014 වර්ෂයේ සියළු වැඩ නිම කල ද ගෙවීම් සඳහා ප්‍රමාණවත් මුදල් මහා භාණ්ඩාගාරයෙන් නොලැබීම නිසා ව්‍යාපෘතියේ බිල්පත් සඳහා හිඟ මුදල් ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන 2015.06.24 දින ලබා දී ඇත. එම වියදම් සම්බන්ධයෙන් සියළු වියදම් වාර්තා මධ්‍යස්ථානය වෙත ලැබී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(iii) යාපනය අර්ධද්වීපය ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය

- ලදුපතක් ගෙනවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

- මෙම ව්‍යාපෘතියද වසර 03 පුරා ක්‍රියාත්මක කරනු ලැබූ එක් ව්‍යාපෘතියක් වන බැවින් අවසන් බිල්පත් ගෙවීමට පෙර ලදුපත හා සියළු බිල්පත්ද ,මෙම ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක්ද ,වැඩ අවසන් කිරීමේ වාර්තාවද විගණනය වෙත ලබා දීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(අ) පෙර සූදානම් සැලසුම් සකස් කිරීම පිළිබඳ කටයුතු

(i)2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව වැඩ සටහන් 797 ක් පැවැත් වූ අතර එම වැඩසටහන් අවසානයේදී ඇගයීම් වාර්තාව සහභාගී වූවන් බහුතරයක් ඉතා පැහැදිලිව අදහස් ප්‍රකාශ කර කර තිබුණු අතර සුළුතර සංඛ්‍යාවක් පැහැදිලිව අදහස් ප්‍රකාශ කර නොතිබුණි. අදහස් ප්‍රකාශ කිරීම පැහැදිලිභාවය ඔවුන්ගේ උනන්දුව මත පදනම් වන කරුණක් වන අතර ඉදිරියේදී ඇගයීම් වාර්තා සම්පූර්ණ කිරීමට දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ වරයාගේ මැදිහත් වීමෙන් පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.

(ii)2014 වර්ෂයේ හතරවන කාර්තුව සඳහා පෙර සුදානම් අංශයට 2014.10.15 දින මුදල් ලැබුණු අතර එම මුදල් ලැබුණු වහාම 2014 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව නිකුත් කල නමුත් හතරවන කාර්තුව සඳහා එ ඒ දිස්ත්‍රිකක් විසින් සැලසුම් කල වැඩසටහන් සඳහා මුදල් එම කාල වකවානු තුල අවශ්‍ය පරිදි නොලැබුණු නිසා එම වැඩසටහන් පැවැතත්වීමේ දින වකවානු 2014 වර්ෂයේ දෙසැම්බර් සහ 2015 වර්ෂයේ ජනවාරි මස පැවැත්වීමට සිදුවිය. ඒ හේතුවෙන් එම මුදල් පියවීම ප්‍රමාද වූ බව කාරුණිකව දන්වා සිටිමි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) මෙම වන්ද්‍රිකා තාක්ෂණ උපකරණ අතරින් Redundant Switch නැමැති උපකරණය අළුත්වැඩියා කටයුතු සඳහා Inova Engineering ආයතනය මගින් රැගෙන ගොස් ඇති අතර එම උපකරණය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි නැවත ලබා දී ඇත. එම උපකරණයද අනෙක් උපකරණ සමගම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ගබඩා කර ඇත.

(ආ) එම වකවානුව වන විට පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 77ක් ස්ථාපිත කර තිබූ අතර එයින් කුළුණු 25 ක් දෙවන අදියර යටතේ වන බැවින් ඒ සඳහා වසරක වගකීම් කාලයක්ද ලැබී තිබුණි. එහෙත් මෙම කුළුණු ලැබූ ආයතන වන ෆෝසයිට් ආයතනය ඇමරිකන් සිග්නල් ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කර ඇති මුත් එම ගිවිසුම් අපවෙත ඉදිරිපත් කර නොතිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය අවසානයේදී මේ සඳහා වූ ගිවිසුම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරන බව ඔවුන් සමඟ පැවති සාකච්ඡාවලදී ප්‍රකාශ කරන ලදි. මෙම ගෙවීම් ෆෝසයිට් ආයතනය හරහා ගෙවීමට මූලික හේතුවක් වනුයේ මෙම ගෙවීම සම්බන්ධයෙන් කොටස් දෙකකට එනම් පළමු අදියරයේ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 52ක් සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් වගකීම් කාලය තුල පිහිටවා ඇති ඉතිරි පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 25හි මෙහෙයුම් සහ ක්‍රියාකාරිත්වය සඳහා වෙන් වෙන් වශයෙන් ඇමරිකන් සිග්නල් කෝපරේෂන් ආයතනයට ගෙවිය නොහැකි බැවින් වඩා පළපුරුද්දක් ඇති ICET ආයතනය හරහා චන්ද්‍රිකා තාක්ෂණික සම්බන්ධතාවය වෙනුවෙන් එලෙස ගෙවන ලදි. මෙම ක්‍රියාව තුන්වන පාර්ෂව කරුවෙකුගේ සම්බන්ධතාවයක් බැවින් ඉදිරියේදී මෙම ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා ඇමරිකන් සිග්නල් කෝපරේෂන් ආයතනය සමඟ සම්බන්ධතාවය ගොඩනගමින් පවතින අතර එම ආයතනය සමඟ මීට ඉහතදී විගණන විමසුමකින් පෙන් වා දී ඇති ආකාරයටම අවබෝධතා ගිවිසුමකටද එලඹීමට කටයුතු කරමින් සිටින බව.

(ඇ)මෙම යතුරු පැදි පවරා ගැනීමට අවශ්‍ය ලිය කියවිලි වල පවතින අඩුපාඩුකම් බලපා ඇති අතර ඉදිරියේ අදාල පවරා ගැනීම් කටයුතු නිසි පරිදි සිදු කිරීමට කටයුතු කෙරේ. පවරා ගැනීම් අවසන් කල වහාම මධ්‍යස්ථානය වත්කම් වලට ඇතුලත් කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඈ) අන්තර් කාලීන කළමනාකරණ කමිටුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව විදේශ ප්‍රදාන ලැබීම් මහා භාණ්ඩාගාරය වෙත යවා ඒ සඳහා අය වැය ප්‍රතිපාදන වෙන් කර ගැනීම සිදු කල යුතුය. ඒ අනුව මෙම රු. 7,410,000 මුදල මහා භාණ්ඩාගාරයට යොමු කර ප්‍රතිපාදන 2014 වර්ෂයේදී ඉල්ලුම් කල නමුත් ලබා ගැනීමට නොහැකි විය. 2015 වර්ෂයේදී එම මුදල අදාල කටයුතු වෙනුවෙන් යොදවා ගැනීම සිදු කර ඇත.

(ඉ) මේ වන විට එම සියළුම භාණ්ඩ බෙදා හැරීම් කටයුතු අවසන් කර ඇත.

(ඊ) ගොඩනැගිල්ල ගිණුම්ගත නොවීමට හේතුව වන්නේ ගොඩනැගිල්ලේ අයිතිය තවමත් මධ්‍යස්ථානයේ නමට පැවරී නොතීම බැව් කාරුණිකව පෙන්වා දෙමි.
ගොඩනැගිල්ල කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඉඩමක ඉදි කර ඇති අතර එම ඉඩම මධ්‍යස්ථානය වෙත පවරා ගැනීමේදී මධ්‍යස්ථානයට විශාල මුදලක් එකවර ගෙවීමට සිදුවන බැවින් එම ගෙවීමට සිදුවන මුදල අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් නිදහස් කර ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී.

(උ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වේයන්ගොඩ ගබඩාවෙන් 2007 වර්ෂයේදී නැතිවූ භාණ්ඩවලට අදාල මුදල් අයකර ගැනීම සඳහා අදාල පාර්ශවයට එරෙහිව නීතිමය කටයුතු මේ දක්වා අවසන්ව නොමැති නිසා ඒ සඳහා අවසන් ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගනීමට නොහැකි වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම අදාල නීතිමය කටයුතු අවසනදී ලැබෙන ප්‍රතිපලය අනුව මෙයට අදාල ගැලපීම් මුල්‍ය ප්‍රකාශනවල සිදුකරනු ලැබේ.

(ඌ) මේ පිළිබඳවද විස්තර ක්‍රමවත්ව මූල්‍ය අංශයට වාර්තා නොවීම හේතුවෙන් අවසන් ගිණුම්වල සටහන් කිරීමට නොහැකි වී ඇති අතර මින් ඉදිරියට අදාළ තොරතුරු පාලන අංශයෙන් ලබාගෙන නිවැරදිව ගිණුමගත කිරීමට කටයුතු කෙරේ.

(එ) මෙම අනතුර සිදුව ඇත්තේ මාතර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයට අනුයුක්ත කර ඇති WPPB7695 වාහනයටයි. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද මූලික පරීක්ෂණයට අනුව එම අනතුරට වගකිව යුතු නිලධාරියා වශයෙන් මාතර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ තනතුරට ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් අනුයුක්ත කර සිටි මේජර් එස්.කේ. බාලසූරිය බව අනාවරණය කර තිබුණි. ඒ අනුව මෙම අනතුර හේතුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සිදුව ඇති මූල්‍ය අලාභය නිලධාරියාගෙන් අය කර ගැනීමට ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් විසින් නියෝග කර තිබුණි. අදාල නිලධාරියා ශ්‍රී ලංකා යුද හමුදාවෙන් අනුයුක්ත කර ඇති නිලධාරියෙක් බැවින් ඔහු සම්බන්ධ සියළු පරිපාලන කටයුතු, වැටුප් ගෙවීම් කටයුතු සහ විනය සම්බන්ධ කටයුතු ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් සිදු කරයි. ඒ අනුව අදාල මුදල මෙම මධ්‍යස්ථානය වෙත යුධහමුදාපතිට ද පිටපත් සහිතව අදාල නිලධාරියා වෙත ලිඛිතව දැනුම් දී ඇතත් මේ දක්වා එම මුදල මධ්‍යස්ථානය වෙත ගෙවා නොමැත.

මේවන විට අදාල නිලධාරියා නැවත ශ්‍රී ලංකා යුධ හමුදාවට කැඳවා ඇති බැවින් අදාල මුදල ඔහුගෙන් අයකරවාගෙන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ගෙවීමට කටයුතු කරන ලෙස යුධ හමුදාලති වරටාට ලිඛිතව දැනුම් දීමට කටයුතු කර ඇත.

4.3 සේවක මණ්ඩල කළමනාකරණය

(අ) <u>තනතුර - අධ්‍යක්ෂ - 01</u>

මෙම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ (මෙහෙයුම්) තනතුර සඳහා කිහිප අවස්ථාවකදීම ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවන ලද අතර සුදුසුකම් ලත් අයෙකු බඳවා ගැනීමට නොහැකි විය. එබැවින් එම තනතුර සඳහා යුධ,නාවික හෝ ගුවන් හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරයකු තාවකාලික පදනමින් පත් කර ගැනීමට ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ තීරණය කිරීමෙන් අනතුරුව එම නිලධාරියෙකු පත් කර ගැනීමට කටයුතු කර ඇත. මේ වන විට නාවික හමුදාවේ නිලධාරියෙකු මෙම තනතුර සඳහා තාවකාලික පදනම මත පත් කර ගෙන ඇත.

<u>තනතුර - නියෝජ්‍ය අධ්‍යක්ෂ - 07</u>

මෙම මධ්‍යස්ථානය සඳහා අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ කළමනාකරණ සේවා ගණය සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු බඳවා ගැනීම් සිදු නොකරන අතර එම තනතුර සහකාර අධ්‍යක්ෂ තනතුරේ I ශ්‍රේණියට පත්වීමෙන් අනතුරුව සහකාර අධ්‍යක්ෂ තනතුරු දරන්නන් අතුරින් ජ්‍යෙෂ්ඨතාවය සහ කුසලතාවය පදනම් කරගෙන නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරුවලට පත් කිරීමට ප්‍රතිපාදන සලසා ඇත.

සහකාර අධ්‍යක්ෂ තනතුරු දරන්නන් සාමාන්‍ය කාර්ය සාධනය යටතේ එම සේවා ගණයේ වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එම සේවා ගණයේ I ශ්‍රේණියට පත් කිරීම සිදු කළ හැකි බව සඳහන්ව ඇති අතර සහකාර අධ්‍යක්ෂ තනතුරේ වසර 06ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කරනු ලබන අය සඳහා වසර 05 සේවා කාලයක් සම්පූර්ණ

වූ පසු අභියෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටීමෙන් අනතුරුව ඉන් සමත් වන අය නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා පත් කළ හැකි බව සඳහන් වේ.

මෙම මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය 2011-07-01 දින සිට ස්ථිර සේවයට බඳවා ගැනීම සිදු කර ඇති අතර ඊට පෙර කොන්ත්‍රාත් පදනමින් සේවය කර ඇත. ඒ අනුව මෙම මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු දරන්නන් සඳහා සුවිශේෂී කාර්ය සාධනය යටතේ අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකමක් වන වසර 05 සේවා කාලයද මේ වන විට සම්පූර්ණ කර නොමැති බැවින් මෙම තනතුර සඳහා පත් කිරීමට හැකියාවක් නොමැත.

තනතුර - පුද්ගලික සහකාර - 01

පුද්ගලික සහකාර තනතුර සඳහා බඳවා ගැනීම සඳහා කිහිප අවස්ථාවකදී ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවුවද සුදුසුකම්ලත් අයෙකු බඳවා ගැනීමට නොහැකි විය. ඒ අනුව මෙම තනතුර සඳහා වූ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කර අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇතත් මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත.

තනතුර - භාෂා පරිවර්තක - 02

මෙම තනතුර සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවුවද සුදුසුකම්ලත් අයෙකු බඳවා ගැනීමට නොහැකි විය.

තනතුර - සන්නිවේදන කාර්මික ශිල්පී -3

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා කිහිප අවස්ථාවකලදී ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවුවද සුදුසුකම්ලත් අයළුවන් බඳවා ගැනීමට නොහැකි වීම හේතුවෙන් බඳවා ගැනීමේ පරිපාටියේ අදාළ සුදුසුකම් සංශෝධනය කර අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත් මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත.

(ආ) ආපදා අවම කිරීම් අංශයේ අධ්‍යක්ෂ (මෙහෙයුම්) ලෙස සඳහන් වී ඇති අතර එය අධ්‍යක්ෂ (අවම කිරීම් හා පර්යේසණ) වශයෙන් සංශෝධනය විය යුතු අතර එහ සංශෝධනයට යටත්ව අදාල පිළිතුර වාර්තා කරන බව කාරුණිකව දන්වා සිටිමි.

නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර

නියෝජ්‍ය අධ්‍යක්ෂ (අවම කිරීම්) නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) තනතුර පුරප්පාඩු වී ඇත. මධ්‍යස්ථානයේ සියළුම නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු බඳවා ගැනීමේ පටිපාටියට අනුව අභ්‍යන්තර උසස්වීම් මඟින් පමණක් පත්කරන අතර ඒ අනුව දැනට සේවයේ යෙදී සිටින සහකාර අධ්‍යක්ෂ නිලධාරීන් එහි දක්වා ඇති සේවා කාලය සම්පූර්ණ කර නොනිබීම මත තවදුරටත් පුරප්පාඩු ව පවති. බඳවා ගැනීමේ පටිපාටිය අනුව මෙම පුරප්පාඩු 2011 වර්ෂයේ ජූලි මස පලවන දින දක්වා පිරවීමට නොහැකි වී ඇත.

සහකාර අධ්‍යක්ෂ (අවම කිරීම්)

සහකාර අධ්‍යක්ෂ (අවම කිරීම්) තනතුරේ සේවය කරන ලද නිලධාරිනිය අධ්‍යක්ෂ තනතුරට පත්වීම හේතුවෙන් මෙම තනතුර පුරප්පාඩු විය. පුරප්පාඩුව පවතින එම තනතුර සඳහා බඳවා ගැනීම පිණිස ප්‍රසිද්ධ පුවත් පත් දැන්වීම් මඟින් අයදුම් පත් කැඳවා 2015.06.26 වන දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලදි. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කරුවන් හතර දෙනෙකු කැඳවන ලද අතර එක් අයෙක් පමණක් ඊට

පෙනී සිටින ලදි. එම අයදුම්කරුද තනතුරට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොමැති බැවින් අදාල පත්වීම සිදුකිරීමට නොහැකි වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

<u>තාක්ෂණික නිලධාරීන්</u>

මෙම නිලධාරීන් පත්කර ගැනීමට පවතින සේවක මණ්ඩල සංයුතිය තුල අවස්ථාවක් නොමැති අතර ඒ සඳහා මධ්‍යස්ථානයේ සේවක මණ්ඩලය පුළුල් කිරීමට අදාල පියවර ගැනීමට මූලික කටයුතු සිදුකරමින් පවතින බැවින් ඉදිරියේදී අදාල නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කෙරේ

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පනත ස්ථාපිත කිරීම.

මේවන විටත් කෙටුම්පත් පනත සඳහා අනුමැතිය ලැබී නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

5.2 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම

ජාතික හදිසි මෙහෙයුම් සැලැස්මේ කෙටුම්පතෙහි අන්තර්ගත විය යුතු කරුණුවල පවතින අඩුපාඩුකම් හේතුවෙන් නැවත එම කෙටුම්පත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ උපදෙස් මත හිටපු අමාත්‍යාංශ ලේකම් තුමියගේ අනුමැතිය ලබා ගන්නා ලදි.

ඒ අනුව 2014 වර්ෂයේ ජුලි මස අවශ්‍ය නිරීක්ෂණ සහ යෝජනා ලබා ගැනීමට කටයුතු කර දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ වරුන්ගේ සහ ප්‍රධාන කාර්යයේ නිලධාරීන්ගේ නිරීක්ෂණ ලබාගැනීමට කටයුතු කරන ලදි. තවද අන්තර් ජාතික සමාන ආකාර සැලසුම් වල කරුණු ලබා ගැනීමට කටයුතු කරන ලදි. ඒ අනුව කෙටුම්පතට අවශ්‍ය තොරතුරු වැඩදුර සාකච්ඡා කර ගැනීම සඳහා අමාත්‍යාංශ නිලධාරීන්ද සමඟ 2014 දෙසැම්බර් මස 19 – 21 දක්වා ද, 2015.01.29 දින බදුල්ලේදීද පවත්වන ලදි. පසුව රාජ්‍ය ආයතන 48 ක නිරීක්ෂණ ලබා ගැනීමට කටයුතු කරන ලදුව නැවතත් 2015.04.08 වන දින කෙටුම්පත සකස් කිරීමට අවශ්‍ය වැඩමුළුවක් පවත්වන ලදි. ඒ අනුව අවසාන වශයෙන් සියළු සහභාගි වූ නිලධාරීන්ද රාජ්‍ය අංශයේ පාර්ෂව ආයතන 48 සහභාගිත්වයෙන් 2015.06.04 සහ 25 යන දින වැඩමුළුවක් පවත්වා අවසන් කෙටුම්පත කැබිනට් මණ්ඩල අනුමැතියට යැවීම සඳහා පරිවර්තන කටයුතු සඳහා යොමුකර ඇත. භාෂා දෙකෙන්ම පරිවර්තන කටයුතු අවසන් වූ වහාම අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමුකෙරේ.

5.3 අභ්‍යන්තර විගණනය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය දිවයිනේ දිස්ත්‍රික්ක 25 තුලම ක්‍රියාත්මක වන ජාතික මිටමේ ආයතනයකි. ඒ අනුව දිස්ත්‍රික්ක 25 තුලම පෙරසූදානම් සැලසුම් කටයුතු, ආපදා අවමකිරීම් ව්‍යාපෘති, දැනුවත් කිරීම් කටයුතු, හදිසි මෙහෙයුම් කටයුතු සහ මානව සම්පත් හා මූල්‍ය කළමනාකරණ කටයුතු සිදු කරයි. මෙම කටයුතු සඳහා භාණ්ඩාගාරය මගින් වාර්ෂිකව විශාල මුදලක් වෙන් කරයි. මධ්‍යස්ථානයෙන් සිදුකරන මෙම පුළුල් සේවා කටයුතු නිසා ඒවායේ විගණන කටයුතු සිදුකිරීමට අභ්‍යන්තර විගණන අංශයේ ධාරිතාවය තවත් වැඩි කළයුතු බව පෙනීගොස් ඇත. එමෙන්ම සියළුම රාජ්‍ය අංශයේ ආයතන්හි අභ්‍යන්තර විගණන අංශවල පවතින ධාරිතාවය ප්‍රමාණවත් නොවන බවත් එම අංශවලට අවශ්‍ය සම්පත් වෙන්කර එම අංශවල ධාරිතාවය වැඩිකිරීමට කටයුතු කල යුතු බවත් අංක COPE/7/1/2014 දරණ 2014 අගෝස්තු 27 වන දින එවන ලද වාර්තාවෙන්ද නියම කර ඇත.

මේ අනුව මධ්‍යස්ථානයේ කාර්යමණ්ඩල පුළුල් කිරීමක් සිදුකිරීමට අවශ්‍ය පියවර ගනිමින් තිබෙන අතර එම පුළුල් කිරීම සඳහා ඉදිරිපත් කරන සැලැස්මට අනුව මධ්‍යස්ථානය සඳහා ප්‍රධාන විගණක නිලධාරීවරයෙක්, තවත් කළමනාකරණ සහකාර නිලධාරියෙක් සහ කාර්යාල සහායක නිලධාරියෙක් ඇතුලත් කිරීමට නියමිතව ඇත.
මේ දක්වා දැනට පවතින සම්පත් යොදාගනිමින් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශය ඉතා ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කරමින් ඇති අතර අමාත්‍යාංශ ලේකම් විසින්ද එය ඇගයීමකට ලක්කර ඇත. ඉදිරියේදී මෙම අංශයේ ධාරිතාවය වැඩිකළ පසු මධ්‍යස්ථානයේ සියළුම අංශ ආවරණය වන පරිදි විගණනය කරමින් පවතින තත්වයටත් වඩා ඉහල කාර්යසාධනයක් පෙන්නුම් කිරීමට හැකියාව ඇත.

6. පද්ධති හා පාලනයන්

වාර්තාවේ (අ),(ආ),(ඇ),(ඈ),(ඉ),(ඊ) යටතේ සඳහන් කර ඇති කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමුකර කටයුතු කර ඇති බව කාරුණිකව සඳහන කරමි.

මේජර් ජෙනරල් එල්.බී.ආර්. මාර්ක් (විශ්‍රාමික)
අධ්‍යක්ෂ ජනරාල්